**2023 පෙබරවාරි මාසයට අදාළව 2023.02.09 දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව.**

❖ **සහභාගිත්වය:**

| | | |
|---|---|---|
| 01. | රංජිත් පියදිගම මැතිතුමා | - ගරු සභාපති |
| 02. | ආර්.එම්.කාන්ත බිමල් රත්නායක මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. | ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. | ජේ.ජී.නිමල් සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. | එම්.ඒ.එම්.ෂබ්රි මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. | ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. | එම්.ඒ.එම්.රසීදු මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 08. | කේ.එම්.ජයසුන්දර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. | පී.එම්.අමරපාල මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. | ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 11. | ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 12. | ආර්.එම්.තුෂාරී ප්‍රියදර්ශනී රත්නායක මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 13. | යූ.ටී.එම්.තරංගා චිත්‍රාණී පුෂ්පලතා මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 14. | පී.අයේෂා චතුර්ණිමා කුෂාන්ති මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 15. | ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**01.පසුගිය මස සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම:**

2023 ජනවාරි මාසයට අදාළව 2023.01.17 වන දින පැවති පසු ගිය සභා රැස්වීමේ වාර්තාව 2023.02.03 දින ම'විසින් සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාහට සහ මන්ත්‍රීතුමියන්ලාහට ලබා දී ඇති අතර, එම වාර්තා මෙම සභාවේ කියවූවාසේ සළකා සහා සම්මත කර ගන්නා මෙන් ගරු සභාපතිතුමන් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

ඒ අනුව 2023.01.17 දිනට අදාළ මාසික සභා රැස්වීම් වාර්තාවට සංශෝධන කිසිවක් ඉදිරිපත් නොකළ හෙයින් සත්‍ය වාර්තා බවට ගරු මන්ත්‍රී කේ.එම්.ජයසුන්දර මැතිතුමන් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි. අනතුරුව 2023.01.17 දිනට අදාළ සභා වාර්තාව සත්‍ය වාර්තා බවට ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මත වීය

**02.ගරු සභාපතිතුමාගේ (මූලාසනයේ) විශේෂ නිවේදන:**

2023 පෙබරවාරි මාසයට අදාළව පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමන්ගේ කාරුණික ආරාධනය පිළිගෙන පැමිණි ගරු උප සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත් සහ ලේකම්තුමන් ඇතුළු සභාවේ කාර්ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමින් ගරු සභාපතිතුමන් අද දිනයට නියමිත විශේෂ නිවේදන සභාවට ඉදිරිපත් කරන ලදි.

වර්තමානය වෙද්දී අප ප්‍රාදේශීය සභාව සඳහා LDSP ව්‍යාපෘතිය දෙවන අධියර යටතේ මුදල් ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදු කර ඇති අතර, ඒ සඳහා ඇස්තමේන්තු කිහිපයක් සකස් කර ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමන් මුලින්ම සඳහන් කරන ලදි. එම යෝජනා යටතේ මැදගම සතිපොළ භූමියේ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ දෙවන මහල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 13.2 ක පමණ මුදලකද ළමා උද්‍යානය වැඩිදියුණු කිරීම සඳහා සෙල්ලම් මිදුලට උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් ලක්ෂ 20 ක පමණ මුදලක්ද එසේම සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අළුත්වැඩියා

කිරීම සඳහා රු.1500000.00 ක මුදලක්ද ඇස්තමේන්තු කර ඉදිරිපත් කර ඇති අතර, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනා සඳහා කඩිනමින් මුදල් වෙන්වෙයි කියා විස්වාසයක් පවතින බවත්, ලක්ෂ 156 ට වැඩි මුදලක් සභාවට නැවතත් හිමි වෙයි කියා බලාපොරොත්තුවක් පවතින බව වැඩිදුරටත් සඳහන් කරන ලදි. එම කටයුතු සඳහා අවස්ථා කිහිපයකදීම අදාළ අමාත්‍යාංශවලට ගොස් මුදල් වෙන් කරවා ගැනීමට කටයුතු කල බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සීමිත මිල ගණන් යටතේ මිල ගණන් කැඳවා ප්‍රසම්පාදනකරුවෙකු තෝරා ගැනීමට සිදුවන අතර, එසේ ප්‍රසම්පාදනකරුවන් තෝරාගෙන කඩිනමින් වැඩ කටයුතු ආරම්භ කල යුතුවේ. අදාළ ව්‍යාපෘති සඳහා ලක්ෂ 90 ක මුදල් සීමාවතෙක් සභාවෙන් මිල ගණන් කැඳවිය යුතුවේ. ලක්ෂ 90 ට එහා ගිය මුදල් සීමාව තුල පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මඟින් මිල ගණන් කැදවා යහපත්වූ ප්‍රසම්පාදනකරුවෙකු තෝරාපත් කර දීමට කටයුතු කරණු ලබයි.

එසේ ප්‍රසම්පාදනකරුවන් තෝරාගෙන කඩ කාමර 13 කින් යුතුව සතිපොල ගොඩනැගිල්ලේ ඉහලමාලය සකස් කිරීමට බලාපොරොත්තු වන බවත්, එම උඩුමහලේ දුර පළාත්වලින් පැමිණෙන ව්‍යාපාරිකයින් සඳහා නාන කාමර සහිතව කුඩා විවේකාගාරයක් නිර්මාණය කිරීමට බලාපොරෙත්තු වන බවත්, ප්‍රකාශ කරන ලද අතර, සතිපොළ භූමියේ සිට කැන්දවින්න මාර්ගයට පිවිසීම සඳහා පිවිසුම් මාර්ගයක් සකස් කිරීම සඳහා මූලික කටයුතු සිදුවෙමින් පවතින බවත්, එසේ මාර්ගය සකස් කිරීමේදී ඉවත් කිරීමට සිදුවන කඩකාමර දෙකෙහි හිමිකරුවන් දෙදෙනා සමඟ සාකච්ඡා කර පොළ භූමියේ ඉදිකර ඇති නව ගොඩනැගිල්ලේ කඩ කාමර දෙකක් ලබාදී එම ස්ථානයෙන් කඩ කාමර 02 ඉවත්කර කඩිනමින් මාර්ගය සකස් කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම මේ කාලයතුල මැතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබුණත් සංවර්ධන කටයුතු කිසිවක් නතර කිරීමට කටයුතු නොකර වැඩ නිම කල යුතු බැවින් සංවර්ධන කටයුතු සියල්ල ඒ ආකාරයෙන්ම සිදුකරගෙන යන බව ප්‍රකාශ කරන ලදි. පසුගිය කාලයේ ළමා උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන අවස්ථාවේ කොන්ත්‍රාත් කරන බව පවසමින් විවිධ කටකතා ප්‍රචාරය කලත් ළමා උද්‍යානයට ඇතුල් වන ස්ථානයේ බෝක්කුවක් නිර්මාණය කර තිබෙන අතර, එම ඉදිකිරීම ඇතුළුව සියළු ඉදිකිරීම සිදුකර ඇත්තේ සභාව සතු කඩා ඉවත් කරන ගොඩනැගිලිවල කොටස් යොදාගෙනයි. ඒ සඳහා ගෙවීම කටයුතු සිදු කරන ලද්දේ පුහුණු කම්කරුවන් ලෙස පෙදරේරුවන්ට පමණි. අමුද්‍රව්‍ය සපයා ගත්තේ වටපිටාවේ කඩා ඉවත් කල ගොඩනැගිලි වලිනි. දැනට ඉදිකරමින් පවතින ගැමි ගෙදර වහලය නිර්මාණය කිරීමට ගරු සභාපතිතුමන්ගේ වත්තෙන් ලී සපයා ගත් බවත් ප්‍රකාශ කරන ලදි. එම ඉදිකිරීම කටයුතු සඳහා මුදලක් ලෙස ගෙවන ලද්දේ පුහුණු කම්කරුවන් සඳහා ගෙවන මුදල පමණි. සභාවේ ඉදිකිරීම් සම්බන්ධයෙන් දැනුම ඇති කම්කරුවන් සමහර වැඩ කොටස් සිදු කල බවත්, එයට අමතරව යොදවාගත් පුහුණු කම්කරුවන් සඳහාත් ඇණ හා තීන්ත මිලදී ගැනීම සඳහා මුදලක් යෙදවූ බව පෙන්වා දෙන ලදි. පාලම ඉදිකරන අවස්ථාවේද සිමෙන්ති, ගල් මිලදී ගත් අතර, වැලි ලෝඩ් එකක් මිලදී ගත් බවත්, අවශ්‍ය වූ ඉතිරි වැලි ප්‍රමාණය සොයා ගැනීමට කටයුතු කල බවත්, ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. මෙම මස අවසන් වීමට පෙර සියළු කටයුතු අවසන් කර දරුවන්ගේ යහපත වෙනුවෙන් මෙම ස්ථානය සකස් කර පවරා දිමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදි.

එසේම ළමා උද්‍යානය තුල සෙල්ලම් බෝට්ටු පැදීම සඳහා කුඩා පොකුණක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින බවත්, පසුගිය වර ක්‍රීඩා පිටියේ පැවති සංදර්ශනයකදී එවන් ස්ථානයක දරුවෙකුට ක්‍රීඩා කිරීමට රුපියල් 400.00 ක මුදලක් අය කල බවත්, කොපමන මුදලක් කිව්වත් දරුවන් එම ක්‍රිඩාවලට ඇලුම් කරන නිසා ඒ සඳහා යොමු වේ. එනිසා ක්‍රීඩා කිරීමට හැකිවන පරිදි පොකුණක් සකස් කරන බවත්, තවත් කුඩා ළමුන් සඳහා සෙල්ලම් කිරීම අවශ්‍ය උපකරණ

කිහිපයක් මිලදීගෙන තිබෙන බැවින් ඒවාද සකස් කර නගරයේ විශාල අඩුවක්ව පැවති ළමා උද්‍යානය සකස් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

එසේම මැදගම මහජන ක්‍රීඩාංගනයේ පැරණි ගොඩනැගිල්ලට ගසක් කඩා වැටී ගොඩනැගිල්ල විනාශයට පත්ව තිබේ. එම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට යෝජිත කඩ කාමර වලින් ඉවත් කරන අමුද්‍රව්‍ය යොදාගෙන කඩිනමින් සකස් කිරීමට බලාපොරොත්තු වන බව පෙන්වා දෙන ලදි. පසුගිය කාලය පුරාවටම ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වලට අවශ්‍ය මූලික පහසුකම් හැකියාවක් පවතින ආකාරයට සැපයූ බව ගරු සභාපතිතුමන් පෙන්වා දෙන ලදි. පසුගිය කාලයේ යෝජනා කර සම්මත කර ගත් මාර්ග කිහිපයක වැඩ කටයුතු ශ්‍රමදාන පදනමින් ගමේ ජනතාවගේ සහභාගීත්වයෙන් පක්ෂ භේදයකින් තොරව සිදු කල බව සඳහන් කරන ලදි. ඒ අනුව එවන්වූ යහපත්වූ වැඩ සටහන් කිහිපයක් නිර්මාණය කරමින් පවතින බව වැඩි දුරටත් සඳහන් කරන ලදි.

ඒවාගේම සතිපොළ භූමියෙහි පවතින ගොඩනැගිල වල කඩ කාමර 03 ක් ඉතිරිව පවතින අතර, එම කඩකාමර තක්සේරු දෙපාර්තමෙන්තුවෙන් තක්සේරු කර ඇති බැවින් එම කඩකාමර ප්‍රසම්පාදනය කර බදුකරුවන්ට භාර දීමට යෝජනාවක් සභාවට ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. එසේ පොළ භූමියේ සකස් කර ඇති ගොඩනැගිල්ලේ වහළය කෙටිව පතින නිසා වර්ෂා කාලයේදී තෙමේ.එනිසා වහලය පුළුල් කර සකස් කර පොළ භූමිය පුළුල් කරගතයුතු බව ප්‍රකාශ කරන ලදි.

විශේෂයෙන් ළමා උද්‍යානයට පිවිසෙන පිවිසුම් මාර්ගයේ පාලම ඉදිකිරීම සඳහා සිමෙන්ති බෑග් - 33 , මැටල් කියුබ් 1 ½ , සක්ක ගල් කියුබ් 04 ක්, වානේ කම්බි 10 ක්, හියුම් පයිප්ප 03 ක් , පෙදරේරුවන් දින 10 ක්, වැලිකියුබ් 02 ක් හා සැටලිං ලෑලි සඳහා රු. 4000.00 ක් පමණය වියදම් වූ අතර, රුපියල් ලක්ෂ 06 ක පමණ වියදමින් සකස් කරන පාලමක් අඩු වියදමින් සභාවේ කම්කරුවන් යොදවාගෙන සිදු කර තිබෙන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. පසුගිය කාලයේ යම් යම් කණ්ඩායම් සභාපතිතුමන්ලා කොන්ත්‍රාත් කරන බව පැවසුවත් ගරු සභාපතිතුමන්ට එවන් අවශ්‍යතාවයක් නොමැති බවත්, කිසි දිනක එසේ කොන්ත්‍රාත් නොකරන බවත්, ප්‍රකාශ කරන ලදි. මේ සඳහා විශාල කැප විමකින් යුතුව කටයුතු කල යුතු බවත්, පාන්දරින්ම පැමිණ සේවකයින් වැඩකටයුතු සඳහා යෙදවීමට සිදුවේ. එසේම වැඩ අවසන්වනතුරුම එම ස්ථානයේ රැඳී සිටිමින් ඒ අවශ්‍ය කටයුතු සිදු කිරීමට සිදුවේ. ඒ ආකාරයට කැපවීමෙන් කටයුතු කල නිසයි ළමා උද්‍යානයට පිවිසෙන මාර්ගය කඩිනමින් සකස් කර ගැනීමට හැකියාව ලැබුණේ යනුවෙන් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

එසේම ළමා උද්‍යානයේ භූමිය ආවරණය වන පරිදි වැට සකස් කර ගැනිමටද අවශ්‍ය වන බවත්, පසුගිය කාලයේ සොර කණ්ඩායම් පැමිණ තිබෙන පොල් ගස්වල පොල් කඩාගෙන යයි. එසේම ගවයින්ගෙන් හානි සිදුවේ. එනිසා බොහොම ඉක්මණින් වැටක් නිර්මාණය කර එම දේපළ ආරක්ෂා කරගතයුතු බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ල කීප අවස්ථාවකම සකස් කිරීමට උත්සාහ කලත් එය සිදුකර ගැනීමට නොහැකිවූ අතර, පසුගිය කාලයේ ගොඩනැගිල්ල සකස් කිරීමට සැලසුම් කර මුදල් පවා ලබා ගැනීමට සියල්ල සූදානම් කරගෙන සිටි අවස්ථාවක ඇතිවූ අරගලකාරී තත්වය හේතුවෙන් සියළු කටයුතු නැවැත්වීමට සිදුවූ බව සඳහන් කරන ලදි. මේ සඳහා ඇස්තමේන්තු පවා සකස් කර තිබේ. ගොඩනැගිල්ලේ වහලය බොහොමත්ම අවධානම් තත්වයට පත්ව තිබෙන බැවින් නව ගොඩනැගිල්ල සකස් කරන තුරු අලුතින් ෂීට් ප්‍රමාණයක් හෝ දමා තාවකාලිකව හෝ සකස් කර ගැනීමට සිදුවන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

එසේම සභා කාර්යාලයේ ගබඩාව ඉතාමත් පහතට සකසා තිබේ.එයට ඇතුල්විම මහත් අපහසුය. එනිසා ගබඩාවද ඉතා කඩිනමින් සකස් කර ගැනිමට සිදුවන බවත්, පසුගිය දිනක අභ්‍යන්තර විගණනයෙන් පැමින ගබඩාව සකස් කල යුතු බව සඳහන්කර තිබෙන බැවින් සකස් කර

ගැනීමට සිදුවන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. පසුගිය දින 06 ක පමණ කාලයක් අභ්‍යන්තර විගණනයෙන් පැමිණ සභාව මගින් සිදුකල කර්මාන්තයන්, පොත්පත්, ලේඛන සියල්ල පරීක්ෂා කල අතර, ඒ තුලින් හඳුනාගත් අඩුපාඩු ප්‍රමාණයක් සඳහන් කර විගණන වාර්තාව අප වෙත ලබාදී ඇති බව සඳහන් කරන ගරු සභාපතිතුමන් එම අඩුපාඩුද නිවැරදි කරගෙන ඉදිරියට කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව සඳහන් කරන ලදි. මෙපමණ කාලයක් අප සභාවට මොනම අවස්ථාවකදී වත් නිලධාරී මණ්ඩලයටවත්, මන්ත්‍රී මණ්ඩලයටවත් අධිභාරයක් ලබාදී නොමැති අතර, ඒ අකාරයට සාධාරණ ක්‍රමවේදයක් තුල සභාවේ කටයුතු පවත්වාගෙන ගිය බව ගරු සභාපතිතුමන් පෙන්වාදෙන ලදි. අප සභාවේ ගිණුම ඌව පළාතේ මතයක් ලබාගත් ගිණුමක් ලෙස ප්‍රකාශයට ඇති බවත්, ඒ පිළිබඳව සතුටට පත්වන බවත්, ඒ ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ ගෞරවය ආරක්ෂා වන පරිදි නිසි ආකාරව සියළු කටයුතු පවත්වාගෙන ගොස් ඇත. ඉදිරියටත් සභාවේ නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කතරන ලදි.

එසේම අද දිනයේ ලිපි ලේඛන හා යෝජනා කිහිපයක් සභාවට ලැබී ඇති අතර, ඒ සම්බන්ධයෙන් කෙටියෙන් සාකච්ඡාවක් පවත්වා හැමදෙනාගේම යහපත වෙනුවෙන් කටයුතු කිරීමට යෝජනා කරමින් ඒ සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහය බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් , අද දිනයේ බොහොම හරවත්වූ සාකච්ඡාවකට ඉඩකට වෙන් කරමින් ගරු සභාපතිතුමන් අද දිනයට නියමිත විශේෂ නිවේදන සභාවට ඉදිරිපත් කිරීමේ අවස්ථාව නිමා කරන ලදි.

**<u>03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ/පෙත්සම්/පැමිණිලි හා සංනිවේදන:-</u>**

**<u>03.01.කඩකාමර දෙකක් අතර මැද බිත්තිය ඉවත් කිරීමට අවශ්‍ය අවසරය ලබා ගැනීම සම්බන්ධවයි.</u>**

වැවේහේන, කරදේගම, පල්ලේකිරුව,ලුණුගල ලිපිනයේ පදිංචි එච්.එම්.නිල්මිණී කුමාරී මහත්මිය විසින් මැදගම නගරයේ කැන්දවින්න මාර්ගයට මුහුණලා ඇති අංක 14 කඩ කාමරය මැදගම 11 කණුව ලිපිනයේ පදිංචි ගම්ලත් හේවගේ ලහිරු දේශාන් සහ හේරත් මුදියන්සේලාගේ නිල්මිණී කුමාරී යන දෙදෙනා එක්ව ව්‍යාපාරික කටයුතු කරගෙන යන අතර, අතරමැද බිත්තියේ කොටසක් ඉවත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්,මැදගම ප්‍රාදේශීය සභාවෙන් දැනුම් දෙන ඕනෑම මොහොතක යථාතත්වයට පත්කර දීමට එකග වන බව දන්වමින් ගරු සභාපතිතුමන් වෙත යොමු කර ඇති ලිපිය සභාවේ දැන ගැනීම පිනිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම ගොඩනැගිල්ලේ උඩුමහලක් පවතින බැවින් සභාවට තීරණයක් ගැනීමට හැකියාවක් නොපවතියි. ඉංජිනේරු මහතාගේ හා කාර්මික නිලධාරීතුමන්ගේ පරීක්ෂා කිරීමකින් අනතුරුව ඔවුන් ගොඩනැගිල්ලට හානි සිදු නොවන බවට තහවුරුවක් ලබා දෙන්නේ නම් කඩා ඉවත් කර ගැනීමට අවසර ලබාදීමට හැකි බව ප්‍රකාශ කරන ලදි.

**<u>03.02.අංක 110 දරණ කඩ කාමරයේ ප්‍රධාන දොර අලුත්වැඩියා කර ගැනීම සම්බන්ධවයි.</u>**

කිරිහල, ප්‍රධාන වීදිය,මැදගම ලිපිනයේ පදංචි ආර්.එම්.සුමිත් බන්දු රත්නායක යන අය විසින් සාප්පු සංකීර්ණයට යාබද කිරිහල නම් කඩ කාමරයක් පවත්වාගෙන යනු ලබන බවත්, මෙහි ප්‍රධාන දොර ලෑලි වලින් සකස් කර ඇති නිසා පාරිභෝගික ආකර්ෂණය දිනා ගැනීමට නොහැකි අතරම ඇතුලත ඇති භාණ්ඩ පිටතට නිසි ලෙස නොපෙනේ. දැනට පවතින මේ තත්වය නිසා ප්‍රධාන දොර වීදුරු වලින් සකසා ගැනීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් සිදු කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

දොර සකස් කර ගැනීමට අවසර ලබාදෙමු. දැනට පවතින දොරේ පවතින ලී සභාවට ලබා දෙන ලෙසට දැනුම් දෙන්න.

**<u>03.03.පාරක් පිලිසකර කර ගැනීම සඳහා කරන ඉල්ලීමයි.</u>**

මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති කෝන්ගොල්ල වසමේ ඇති කෝන්ගොල්ල එකමුතු ගොවි සංවිධානයට අයත් හෙල අරාව යායේ කුඹුරු වගා කලාට පසුව එම කුඹුරු යායට

වාහනයක් ගැනීමට නොහැකි බව දන්වා සිටිමු.මැදගම නගරයේ සිට කොටබෝවට යන ප්‍රධාන මාර්ගයේ මොනරවාන ගමේ (3 කණුව) එම ගමේ පාසැලට නුදුරින් කෝන්ගොල්ලට යන පාරක් ඇත. එම පාරේ අතුරු පාරකින් මෙම හෙල අරාව යායේ දෙහිගහ ඉර යන කුඹුරට යාමට හැකි බවද දන්වා සිටිමි . මොනරවාන ගමේ සිට කෝන්ගොල්ල ගමේ හෙල අරාව යායේ දෙහිගහ ඉරකුඹුරට සම්බන්ධවන ස්ථානය මෙම මාර්ගයේ අවසානය වන බව ප්‍රකාශ කරමි. මෙම මාර්ගය අවසානයේ විශාල වලක් ඇති නිසා මෙම කුඹුරු යායට වාහනයක් ගැනීමට නොහැකි බව දන්වා සිටිමි. මෙම මාර්ගය රජයෙන් වෙන් කර ඇති බව දන්වා සිටින අතර, මාර්ගය මෝටර් ග්‍රේඩරයකින් කපා පාරේ කාණු දමා මාර්ගය අවසානයේ ඇති වල පුරවා එම ස්ථානය පමණක් කොන්ක්‍රීට් කරදීමට කටයුතු සලසා දෙනමෙන් ඉල්ලමි. යනුවෙන් සදහන් කරමින් කෝන්ගොල්ල එකමුතු ගොවි සංවිධානය විසින් ගරු සභාපතිතුමන් වෙත යොමු කර ඇති ලිපිය සභාවේ දැන ගැනීම පිනිස ඉදිරිපත් කරන ලදි.

**<u>03.04.ක්‍රීඩා පිටිය විශාල කර ගැනීම සදහා.</u>**

බකිණිගහවෙල සිංහල කණිටු විදුහලේ ක්‍රීඩාවට දක්ෂ දරුවෝ අධ්‍යාපනය හදාරන බවත්, ඔවුන්ට ක්‍රීඩාවෙන් ඉදිරියට යෑමට නොහැකිවී ඇත්තේ පුහුණුවීම් සදහා ක්‍රීඩා පිටිය ප්‍රමාණවත් නොවීමයි.එම නිසා අප විද්‍යාලයේ ක්‍රීඩාපිටිය විශාල කර සකසා දෙන ලෙස ඉල්ලමින් එම විද්‍යාලයේ විදුහල්පති ඩී.එම්.ආරියරත්න මහතා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවේ දැනගැනීම පිනිස ඉදිරිපත් කරන ලදි.

**<u>03.05.පනික්කාවත්ත කොස්වත්ත මාර්ගය පිළිසකර කර ගැනීම සදහා</u>**

පනික්කාවත්ත සිට කොස්වත්ත දක්වා වූ මාර්ගය වසර ගණනාවක සිට පිළිසකර කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් ඉතා අබලන් තත්වයට පැමිණ ඇත. පාරේ වලවල් සෑදී ඇති අතර, කාණු පද්ධතිය වැසී ගොස් ඇති බැවින් කිසිදු වාහනයකට මෙම පාරේ ගමන් කිරීමට නොහැකි තත්වයක් උදාවී තිබේ. මෙම ගම්මානවල පවුල් 60 – 70 ක් පමණ ජීවත්වන අතර, ඔවුන්ගේ ප්‍රධාන ජීවන මාර්ගය වන පොල්, පුවක්, රබර් ආදිය වෙළදපොළට ගෙන ඒමේදී මහත් අසීරුතාවලට මුහුණ දීමට සිදුවන බවත්, හදිසි අවස්ථාවකදී රෝගියකු රෝහලට ගෙනයෑම සදහාද මහත් වෙහෙසක් දැරීමට සිදුවන බැවින් මෙම මාර්ගය ග්‍රේඩර් කර කාණු පද්ධතිය සකසා දෙනමෙන් ඉල්ලීම් කර කින්නරබෝව, පනික්කාවත්ත, මැදගම ලිපිනයේ පදිංචි ඩබ්.එම්. සුදුනිලමේ මහතා විසින් යොමු කර ඇති ලිපිය සභාවේ දැනගැනීම පිනිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදි.

**<u>03.06.කැන්දවින්න පාර සතිපොළ කඩකාමර අංක 06 සම්බන්ධවයි.</u>**

මහගංගොඩ, කැන්දවින්න,මැදගම ලිපිනයේ පදිංචි එම්.ජී.විමලදාස මහතා විසින් පවත්වාගෙන යන කැන්දවින්න පාර සතිපොල කඩ කාමර අංක 06 කඩ කාමරයේ සෙවිලි කර ඇති ඇස්බැස්ටෝස් ෂීට් 03 ක් පමණ කැඩී ඇති බැවින් දැනට කඩා ඉවත්කරන කැන්දවින්න පාර අංක හතර හා පහ කඩ කාමරවල ඇති ඇස්බැස්ටෝස් ෂීට් කිහිපයකින් වසා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති ලිපිය සභාවේ දැනගැනීම පිණිසස ගරු සභාපතිතුමන් ඉදිරිපත් කරන ලදි.

**<u>03.07. නො.07 කඩකාමරය පිළිබදවයි.</u>**

නො. 07,සතිපොළ වෙළද සංකීර්ණය, මැදගම ලිපිනයේ පදිංචි බී.එල්.අමරසිරි මහතා මැදගම නගරයේ වෙළද සංකීර්ණයේ තිබූ නො.07 කඩ කාමරය නව සතිපොළට අවශ්‍ය මාර්ගය සකස් කිරීම සදහා 2022.12.31 දින කඩා ඉවත් කරන ලදි. එම නිසා 2023 ජනවාරි මාසය සදහා කුලී ගෙවීමට නොහැකිය. එම නිසා නව කඩ කාමරයක් ලබාදෙන ලෙස ඉල්ලා ගරු සභාපතිතුමන් වෙත යොමු කර ඇති ලිපිය සභාවේ දැන ගැනීම පිනිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදි.

<u>ගරු මන්ත්‍රී - ප්‍රේමපාල මැතිතුමා</u>

කඩ කාමරය කඩා ඉවත් කර ඇත්තේ නම් කඩ කුලිය ගෙවීමට නොහැකියි.

<u>ගරු සභාපතිතුමා</u>

කඩ කාමර භාර දුන්නේ පෙබරවාරි මාසයේයි. තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ලබාදුන්නේද පෙබරවාරි මාසයේයි. ඒහේතුවෙන් 2023 ජනවාරි මස කුලි අය නොකිරීමට ගරු සභාව තීරණය කරන ලදි.

**<u>03.08.නිවසට පැමිණෙන මාර්ගය සකස් කර ගැනීම</u> (පුංචි බණ්ඩාර මයා)**

**04. <u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න : - නැත</u>**

**05. <u>යථා පරිදි කල්දී ඇති යෝජනා</u> :-**

**<u>05.01.යෝජනාකරු:- ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - පෙරපාසල් ගාස්තු සංශෝධනය</u>**

මැදගම ප්‍රාදේශීය සභා පෙර පාසලේ ගුරුවරියන්හට දෙමාපියන් වශයෙන් ගෙවන මුදල් ප්‍රමාණය වර්තමාන කාලයට, ආර්ථිකයට, ඔවුන් කරන සේවයට ප්‍රමාණවත් නොවන බවත්, සෙසු පෙරපාසල් වල ගුරුවරියන් සඳහා ගෙවන දීමනාව ඉතා ඉහල බවත්, අනෙකුත් පෙරපාසල්වල ගෙවන දීමනාවට සරිලන දීමනාවක් දෙමාපියන් වශයෙන් ගෙවීමට හැකියාවක් පවතින බව සඳහන් කර අදාළ දීමනාව රුපියල් 1500.00 ක් කර සංශෝධනය කරන ලෙසට යෝජනා කර ඇති අතර, අදාළ දීමනාව සංශෝධනය කිරීම සුදුසුද යන්න පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීමට මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපතිතුමන් ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද අතර, සෙසු පෙරපාසල් වලට සාපේක්ෂය සභාවේ පෙර පාසලෙන් යම් සහනයක් සලසා දිය යුතු බව පවසමින් පෙරපාසල් ගාස්තුව රු.1400.00 අය කර එයින් රු.50.00 ක මුදලක් සභාවට අයකර 1350.00 ක මුදලක් දීමනාව ලෙස ගෙවීම සුදුසු බව තීරණය කල හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**<u>05.02.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම</u>**

මැදගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය අක්‍රීය වී ඇති බැවින් දෛනික රාජකාරී කටයුතු පවත්වාගෙන යෑම මහත් අපහසු කාර්යයක් බවට පත්ව තිබේ. මෙම ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා John Keells Office Automation පුද්ගලික ආයතනයෙන් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර, එම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**<u>05.03.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - 252 – 6338 කැබ් රථය අළුත්වැඩියා කිරීම.</u>**

මැදගම ප්‍රාදේශීය සභාව සතු 252 – 6338 අංක දරණ කැබ් රථයේ රේඩියේටර අළුත්වැඩියා කිරීම හෝ අළුතින් යෙදීම,බ්රේක් ඩිස්, බ්රේක් පෑඩ්,බෝල් ජොයින්ට්,අපර් ආම්, CV ජොයින්ට්,සිග්නල් කප් යෙදීම, කැබ් රථයේ පිටුපස කැනපිය සකස් කිරීම,විදුලි පද්ධතිය සකස්

කිරීම යනාදී අළුත්වැඩියාවන් සිදු කල යුතු අතර, අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.
යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**<u>05.04.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - සතිපොළ ගොඩනැගිල්ලේ තක්සේරුව ක්‍රියාත්මක කිරීම</u>**

මැදගම නව සතිපොළ භූමිය තුල ඉදිකර ඇති ගොඩනැගිල්ලෙහි කඩ කාමර බදු දීමට පෙර එම කඩ කාමර තක්සේරුවක් කර ගැනීම සඳහා 2022.11.30 දිනැති ලිපිය මගින් අප සභාව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කල අතර, එම ඉල්ලීමට අනුව කඩ කාමර තක්සේරුවක් සිදු කර 2023.01.17 දිනැතිව සභාව වෙත අදාළ තක්සේරුව ලබාදී ඇත. එම තක්සේරුව 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - කේ.එම්.ජයසුන්දර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විවිධවූ අදහස් ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ එක් කඩ කාමරයක් සඳහා රු.50000.00 ක තැම්පත් මුදලක් හා මාසික කුලිය ලෙස රු.9000.00 ක මුදලක් වන පරිදි එක් කඩ කාමරයක් සඳහා ගෙවිය යුතු මුදල තක්සේරු කර එවා තිබෙන අතර, ඇප තැම්පත් මුදල කොටස් වශයෙන් ගෙවීමට ක්‍රමවේදයක් සකස් කර දීමට හැකියාව තිබේ නම් සකස් කර දෙන බව ප්‍රකාශ කරන ලදි.

<u>ෂබ්රි මන්ත්‍රීතුමා</u>

කුලී මුදලත් සාකච්ඡා කර අඩුකර දිය හැකි නම් සුදුසු වන බව ප්‍රකාශ කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කර ඇති තක්සේරු මුදල අඩු කිරීමට හැකියාවක් නැත. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පැමිණ කඩ හිමියන්ගෙන් තොරතුරු ලබාගෙන ඔවුන් ගෙවන මුදල සොයා බලා මෙම තක්සේරුව ලබාදී තිබේ. සභාවට 9000.00 ක බදු මුදලක් ගෙවන කඩහිමියා එය බදු දෙන්නේ රු.20000.00 ක පමණ මුදලකටයි.

<u>ෂබ්රි මන්ත්‍රීතුමා</u>

කඩ කාමර සඳහා ගෙවීමට ඇති ඇප තැම්පත් මුදලට සහනයක් ලබා දෙන්න. එක්වර එතරම් මුදලක් ගෙවීම සමහර ව්‍යාපාරිකයින්ට අපහසුවේ.

<u>උප සභාපතිතුමා</u>

කොටස් දෙකකින් ගෙවීමට අවස්ථාව ලබා දෙන්න.

<u>නිමල් මන්ත්‍රීතුමා</u>

ගෙවීමට හැකියාවක් තියෙන අයගෙන් ලබා ගන්න. එසේ නොමැතිව යම් ව්‍යාපාරිකයකු ඉල්ලීමක් කරන්නේ නම් කොටස් දෙකකින් ගෙවීමට ඔහුට අවස්ථාව ලබා දෙන්න.

<u>ෂබ්රි මන්ත්‍රීතුමා</u>

තක්සේරුවක් සිදු කරන්නේ වසර කීයකට වරක් දැයි විමසීමක් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

සියළු ගොඩනැගිලි වසර 05 කට වරක් තක්සේරු කරන බවත්, වසර 03 කට වරක් ගිවිසුම් අත්සන් කරන බවත්, ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව උක්ත යෝජනා සම්බන්ධයෙන් දීර්ග ලෙස සාකච්ඡා කල සභාව ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාව සඳහා විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලදි. එයට අමතරව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කීමනි ( යතුරු ගාස්තු)ලෙස ගෙවියුතු බව සටහන් කර ඇති රු.50000.00 මුදල ගෙවීමට අපහසු බව පවසමින් ඉල්ලීමක් කරන්නේ නම් එය කොටස් දෙකකින් ගෙවීමට අවස්ථාව ලබා දීමට තීරණය කරන ලදි. ඒ අනුව උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**<u>05.05.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - පුස්තකාල සාමාජික ගාස්තුව සංශෝධනය කිරීම</u>**

මැදගම ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාලයන්හි සාමාජිකත්වය ලබා ගන්නා අවස්ථාවන්හි වැඩිහිටි සාමාජිකයකු සාමාජික කර ගැනීම සඳහා රුපියල් 200.00 ක මුදලක්ද ළමා සාමාජිකයකු සඳහා රුපියල් 100.00 ක මුදලක්ද අයකරණු ලබයි. එසේ වුවද මොනරාගල දිස්ත්‍රික්කයේම මහජන පුස්තකාලවලින් සාමාජික මුදල් ලෙස රු. 100.00 ක මුදලක් වැඩිහිටි හා ළමා යන සියළුම සාමාජිකයින්ගෙන් ලබා ගැනීමට යෝජනා කර ඇති බැවින් අදාළ අය කිරීම් යටතේ සමාජිකයින් බඳවා ගැනීම සුදුසු වන බවත්, එසේ සාමාජිකත්වය ලබාගන්නා අවස්ථාවේ නිකුත් කරණු ලබන සාමාජික අයදුම් පත්‍රය සඳහා රු.20.00 ක මුදලක් අය කිරීම සුදුසු වන බවත්, මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ජේ.ජී.නිමල් සරත් කුමාර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලය විවිධ වූ අදහස් ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

සාමාජික ගාස්තු ලෙස රු.100.00 ක මුදලක් ගෙවා විශාල මුදලකට පොත් පරිශීලනය කරයි. මෙය විශාල ගැටළුවකි. නමුත් මෙම මුදල පොදුවේ පුස්තකාල සේවා මණ්ඩලයෙන් තීරණය කර තිබේ.

ඒ අනුව ගරු සභාපතිතුමන් ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**<u>05.06.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීම සම්බන්ධවයි.</u>**

මැදගම නගරය තුල මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වීම තුලින් රජයේ කාර්යාලවල දෛනික කටයුතුවල බාධා ඇතිවන අතර, එසේ මැතිවරණ රැලි පැවැත්වීම ව්‍යාපාරික ප්‍රජාවටද මහත් අවහිරයක් වන බව දැනුවත් කර තිබේ. එබැවින් පළාත් පාලන මැතිවරණයේ මැතිවරණ ප්‍රචාරක රැලි මහජන ක්‍රීඩාංගණයේදී පමණක් පැවැත්වීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලය විවිධ වූ අදහස් ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

මැතිවරන රැලි නගරයේ පවත්වන විට වාහන නවතා තබන ස්ථාවල සිටින පුද්ලයින්ට අවහිරතා ඇතිවන බවත්, එසේම නගරයේ බැංකු 06 ක් පවතියි, තවද රජයේ කාර්යාල කිහිපයක්ද නගරයේ ස්ථාපිත කර තිබෙන බැවින් ඒ සඳහා බාධා ඇතිවේ.

නිමල් මන්ත්‍රීතුමා

පසුගිය වසරේද මෙම ගැටළුව ඇතිවූ බව ප්‍රකාශ කරන ලදි.

ෂබ්රි මන්ත්‍රීතුමා

මැතිවරණ රැලි පැවැත්වීම නගරය තුල සීමා කර සියළුම රැලි ක්‍රීඩාංගනයේදී පැවැත්වීම සුදුසු වේ.

උදය බන්දුල මන්ත්‍රීතුමා

කොන්දේසි නීති රීති ගෙන ආවේ මේ මැතිවරණයේදීයි. මීට පෙර මැතිවරණවල එසේ සිදුකර නැත. මීට පෙර පැවති මැතිවරණ වලදී සියළු දේශපාලන පක්ෂ ඕනෑ තරම් මේ භූමියේ රැස්වීම් පවත්වා තිබේ. 2004 වර්ෂයෙත් ගරු සභාපතිතුමාත් මන්ත්‍රීතුමාත් එකට දේශපාලනය කර එදිනත් සභාපතිතුමා බන්දුල මන්ත්‍රීතුමාට අවස්ථාව නොදී නගරයේ රැස්වීම් පැවැත්වීම වෙනත් පුද්ගලයකුට අවස්ථාව ලබාදුන් බව ප්‍රකාශ කරන ලදි. එවන්වූ අසාධාරණකම් නොකරන ලෙසට දැනුම් දෙන ලදි. රැස්වීම් නොපවත්වන ලෙස දන්වා පැමිණිලි ඉදිරිපත් කර ඇත්තේ කොහේද? මීට පෙර එසේ සිදු නොකලේ ඇයි?

ගරු සභාපතිතුමා

නගරයේ බැංකු 06 ක් ස්ථාපිත කර තිබේ. ඒවායේ දෛනික කටයුතු කිරීමේදී රැස්වීම් පැවැත්වීම අවහිරවේ. එනිසා. ඔවුන් කල පැමිණිලිද තිබෙන බව ප්‍රකාශ කරන ලදි.

බන්දුල මන්ත්‍රීතුමා

මීට පෙර මැතිවරණ වලදීද රජයේ ආයතන ඇතුළු සියල්ල තිබුණි.එසේ තිබියදී නීති පැනවූයේ නැත්තේ ඇයි දැයි විමසීක් කරන ලදි.

ගරු සභාපතිතුමා

මීට පෙර නගරයේ එතරම් තදබදයක් නොතිබුණි. වර්තමානය වන විට නගරය තුල විශාල වාහන ප්‍රමාණයක් එක්රැස්වේ. එනිසා ප්‍රශ්න වැඩිවේ. පසුගිය වසරවල බොජුන්හල ඉදිකර ඇති භූමියේ රැස්වීම් පවත්වන ලදි. දැන් බොජුන්හල ඉදිකර ඇති නිසා ඒ භූමිය යොදාගත නොහැකියි.

බන්දුල මන්ත්‍රීතුමා

පසුගිය කාලයේ පැවති මැතිවරණ වලදී එක්සත් ජාතික පක්ෂයෙන්,අනෙකුත් දේශපාලන පක්ෂවලින් නගරයේ රැස්වීමක් පවත්වන ලදි. ඒ සඳහා විරුද්ධත්වයක් ප්‍රකාශ නොකරන ලදි. ගරු සභාපතිතුමන්ලා මෙම වසරේ නීති උපදෙස් ලබාගෙන මැතිවරණ රැලි පැවැත්වීම ක්‍රීඩා පිටියට ගෙන යැමට තීරණය කර තිබෙන බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා

අනෙක් දේශපාලන පක්ෂ වගේම ගරු සභාපතිතුමන්ලාගේ පක්ෂයෙනුත් නගරයේ මැතිවරණ රැලි නොපවත්වන බව ප්‍රකාශ කරන ලදි.

බන්දුල මන්ත්‍රීතුමා

සභාපතිතුමන්ලා මැතිවරණ රැලි නොපවත්වන්නේ පවතින තත්වය අනුව මැතිවරණ රැලි පැවැත්වීමට නොහැකි නිසා බව ප්‍රකාශ කරන ලදි

ගරු සභාපතිතුමා

මැතිවරණ රැලි පැවැත්වීමට නොහැකියාවක් නොමැති බව පෙන්වාදෙන ගරු සභාපතිතුමන් මැතිවරණයක් පැවැත්වීමට තවමත් තීරණයක් ලබාදී නොමැති නිසා රැලි නොපවත්වන බවත්, නියමිත කාලයට එතුමන්ලා එම කටයුතු සිදුකරන බව ප්‍රකාශ කරන ලදි.

බන්දුල මන්ත්‍රීතුමා

රටේ ජනතාවට අවශ්‍ය උදව් කරන සභාපතිතුමන්ලාම මෙහි නායකයෝ වෙන්න ඕනිද. සභාපතිතුමන්ලාම මෙහි සිටිය යුතුයි. පසුගිය කාලයේ හොඳින් පාලනය කලානේ. නමුත් බන්දුල

මන්ත්‍රීතුමන් පවසන්නේ මෙවන් සභාවක් මෙලෙස හිතුවක්කාරී තීන්දුවක් ගෙන සතුටුවන්නේ ඇයි දැයි විමසීමක් කරන ලදි.

ගරු සභාපතිතුමා

හිතුවක් කාරී තීන්දුවක් ගෙන නොමැති බවත්, එයින් සතුටට පත්නොවන බවත්, සියළුම දෙනාට පොදුවේ මෙම තීරණය ගෙන ඇති බව සඳහන් කරන ලදි.

බන්දුල මන්ත්‍රීතුමා

සමාජයේ කවුරුත් බොහොමත්ම අපහසුවෙන් ජීවත්වන අය වේ. එසේ ඇඟට දැනිලත්, ගෙදරට දැනිලත්, පවුලට දැනිලත්, සමාජයට දැනිලත් මෙවන්වූ කාලකන්නි වැඩ කරන්නේ ඇයිද කියා විමසීමක් කරන ලදි.

නිමල් මන්ත්‍රීතුමා / ෂබ්රි මන්ත්‍රීතුම

ක්‍රීඩාංගනයේ මැතිවරණ රැලි පැවැත්වීම මන්ත්‍රීතුමන්ලාටද විශාල අවාසියකි.නමුත් බොහෝ දෙනාගේ ඉල්ලීම වන්නේ නගරය තුල මැතිවරණ රැලි නොපවත්වන ලෙසයි.

බන්දුල මන්ත්‍රීතුමා

මුළු ලංකාවේම නගර තුලයි මැතිවරණ රැලි පවත්වන්නේ. මැදගම නගරයේ පමණයි එසේ අවසර ලබා නොදෙන්නේ.

නිමල් මන්ත්‍රීතුමා

බන්දුල මන්ත්‍රීතුමා නොව නිමල් මන්ත්‍රීතුමන්ලා නගරය තුල නිරන්තරයෙන් රැදෙන බවත්, ව්‍යාපාරිකයින් බොහෝ පිරිසක් චෝදනා කරන බවත් ප්‍රකාශ කරන ලදි.

මහේෂ් මන්ත්‍රීතුමා

ගරු සභාපතිතුමන් ඉදිරිපත් කල යෝජනාව ස්ථිර කිරීමට ප්‍රධානම හේතුව වන්නේ පසුගිය කාලයේ දැනට මාස 06 ට පමණ පෙර අරගල ක්‍රියාකාරීන්ගේ ක්‍රියාවන් නිසා රටතුල භීෂණකාරී තත්වය හේතුවෙන් මිනිස් ජීවිත පවා අහිමි විය. මේ වනවිට ජනතාව නගරයට පැමිණෙන්නේ දැඩි පීඩනයකිනි. එනිසා මොන පක්ෂයෙන් මැතිවරණ ව්‍යාපාරයේ යෙදුනත් මහජන නියෝජිතයින් දෙස බලන්නේ පසුගිය මාස 06 / 07 ක කාලයක් තුල බැලූ ආකාරයට සමාන ආකාරයටයි.එනිසා ගැටුම් ඇතිවීම වලක්වා ගැනීමට ක්‍රීඩා පිටියේ මැතිවරණ රැලි පැවැත්වීමේ යෝජනාව ස්ථිර කරන බව සඳහන් කරන ලදි.

උදය බන්දුල මන්ත්‍රීතුමා

කවුරුන් යෝජනා කලත්, කවුරුන් යෝජනා ස්ථිර කලත් එසේ නම් ලංකාව පුරාවට පවත්වන මැතිවරණ රැලි සඳහා ගරු සභාපතිතුමන්ට මැදිහත්වී නැවැත්වීමට කටයුතු කල යුතුයි. එසේ තීන්දු ගැනීම තුල සභාපතිතුමන්ලා පිළිබඳව පවතින හොඳහිත නැතිවේ.

ගරු සභාපතිතුමා

තීරණය ගෙන ඇත්තේ බන්දුල මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂයට පමණක් නොව පොදුවේ සෑම පක්ෂයකටමයි. ලංකාවේම තිබෙන මැතිවරණ රැලි නැවැත්වීමට ගරු සභාපතිතුමන්ට බලතල නොමැති බවත්, මැදගම සභා බල ප්‍රදේශයට අදාළ තීන්දු තීරණ පමණක් ගැනීමට හැකියාවක් පවතින බව පෙන්වාදෙන ලදි.

මහේෂ් මන්ත්‍රීතුමා

ක්‍රීඩා පිටියේ සිට නගරයට ඇත්තේ මීටර 100 ක පමණ දුරකි. ඒ මීටර් 100 ක දුරට ක්‍රීඩා පිටියට නොගොස් නගරයේ මැතිවරණ රැලි පවත්වා ගැටළු ඇති කරගන්නේ කුමකටද? මෙම ගැටළුව ඇත්තේ බන්දුල මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂයට පමණක් නොව අනෙකුත් සෑම පක්ෂයකටම මේ ගැටළුව පවතියි.

ගරු සභාපතිතුමා

බන්දුල මන්ත්‍රීතුමන් ඉල්ලීම් කල සෑම අවස්ථාවකම ලබා දිය හැකි සහා දේපළ ලබාදීමට ගරු සභාපතිතුමන් කටයුතු කල බව ප්‍රකාශ කරන ලදි. එසේ ලබා නොදෙන්නේ නම් සම්මන්ත්‍රණ ශාලාවද ලබා නොදීමට තිබුන බව ප්‍රකාශ කරන ලදි.

උදය බන්දුල මන්ත්‍රීතුමා

එසේ සම්මන්ත්‍රන ශාලාව නොදී සිටීමට හැකියාවක් නොමැති බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා

සම්මන්ත්‍රණ ශාලාවේ පවතින උපකරණ සදහා හානි සිදුකරනවා සේම කාර්යාල කටයුතු පවත්වාගෙන යෑමට ගැටළු ඇතිවෙනවා කියා කුලියට ලබාදීමෙන් වැලකී සිටීමට බලයක් පවතින බව ප්‍රකාශ කරන ලදි.

උදය බන්දුල මන්ත්‍රීතුමා

එසේ කටයුතු කලහොත් මතුවන්නේ වෙනමම කතාවකි. සභාපතිතුමන්ගේ කුහකකම ඉස්මතුවේ. එසේම සභාපතිතුමන් තුල නීතියක් නොමැති බව පෙනීයයි. ජනතාව ඒ සියල්ල දැන ගන්නා බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා

කුහකයින් කවුදැයි කියා සභාපතිතුමන්ලා හොදින් දන්නා බව ප්‍රකාශ කරන ලදි.

උදය බන්දුල මන්ත්‍රීතුමා

මන්ත්‍රීතුමන්ලා සෑහෙන කුහකකම් කර තිබෙන බව ප්‍රකාශ කරන ලදි. සභාපතිතුමන්ට එතරම් බලයක් පවතින්නේ නම් ඉතිරි නගරවලත් පවත්වන මැතිවරණ රැලි නැවැත්වීමට කටයුතු කරන්න.

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමන් කතා කරන්නේ මැදගම නගරය පිළිබදවයි. අනෙක් නගර ගැන කතා නොකල බව සදහන් කරන ලදි.

උදය බන්දුල මන්ත්‍රීතුමා

සභාපතිතුමන්ට මේ මැදගම නගරයක් නොමැති බවත්, සභාපතිතුමන්ගේ හූදලයක් මෙහි නොමැති බව ප්‍රකාශ කරන ලදි. සභාපතිතුමන් ප්‍රදේශයේ ප්‍රධානියෙක් පමණක් වන බව ප්‍රකාශ කරන ලදි.

නිමල් මන්ත්‍රීතුමා

මැදගම සහා බල ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා ගරු සභාපතිතුමන්වේ. ප්‍රදේශයට අදාළ තීන්දු තීරණ ගැනීමට හැකියාව පවතින්නේ එතුමන්ට බව සදහන් කරන ලදි.

උදය බන්දුල මන්ත්‍රීතුමා

ප්‍රධාන පුරවැසියානම් ඔහු අන්අයට ආදර්ශමත්විය යුතුයි. සැමට සාධාරණ තීන්දු තීරණ ගත යුතුයි. ප්‍රධාන පුරවැසියා නම් ඒ පුරවැසියා මෙවන්දේද කරන්නේ?

ෂබ්රි මන්ත්‍රීතුමා

ක්‍රීඩා පිටියේ මැතිවරණ රැලි පැවැත්වීමට අවසර ලබා දෙන්නේ නම් මන්ත්‍රීතුමන්ද ක්‍රීඩාපිටයේ මැතිවරණ රැලියක් පවත්වන බව ප්‍රකාශ කරන ලදි.

උදය බන්දුල මන්ත්‍රීතුමා

ෂබ්රි මන්ත්‍රීතුමන්ට අවශ්‍ය මන්ත්‍රීතුමන් කියන ස්ථානයක බන්දුල මන්ත්‍රීතුමන් රැස්වීම නොපවත්වන බවත්, බන්දුල මන්ත්‍රීතුමන්ට අවශ්‍ය ස්ථානයේ එතුමන් රැලිය පවත්වන බවත්, ප්‍රකාශ කරන ලදි. වෙනත් අයට නැතිව අපට පමණක් නීතිය නමන්නේ ඇයිදැයි විමසීමක් කරන ලදි.

ෂබ්රි මන්ත්‍රීතුමා

රැස්වීම් සංවිධානය කරන අයට ක්‍රීඩාපිටිය ලබාදෙන්න.ඒ අයට ඒ අවස්ථාව ලබාදෙන්න.

මහේෂ් මන්ත්‍රීතුමා

පසුගිය අරගල කාලයේ කඩවලින් සල්ලි බලෙන් අරගෙන, අරක්කු අරගෙන කටයුතු කලේ කවුරුන්දැයි කියා නගරයේ සිටි මන්ත්‍රීතුමන් දන්නා බව ප්‍රකාශ කරන ලදි.

<u>උදය බන්දුල මන්ත්‍රීතුමා</u>

බන්දුල මන්ත්‍රීතුමන්ලා කිසිදිනක අරක්කු ලබාගෙනත් නෑ, කිසි දිනක සල්ලි අරගෙනත් නෑ මන්ත්‍රීතුමන්ලා සෑම දිනකම සාමකාමී උද්ඝෝෂණ පමණක් සිදුකල බව ප්‍රකාශ කරන ලදි.

<u>මහේෂ් මන්ත්‍රීතුමා</u>

බන්දුල මන්ත්‍රීතුමන් එසේ අරක්කු, මුදල් ලබාගෙන නැතිවිය හැකියි. නමුත් එතුමන් නියෝජනය කරන පක්ෂයේ සාමාජිකයින් එසේ පගාවල් ගන්නා බව ප්‍රකාශ කරන ලදි.

<u>උදය බන්දුල මන්ත්‍රීතුමා</u>

කඩයකට ගොස් ඉල්ලා ගැනීම යුතුකමකි.නමුත් බලෙන් ලබා ගැනීම වෙනත් දෙයකි. කඩහිමියන් ඒ පිළිබඳව කතාවෙයි. මෙරට වෙනස් විය යුතුයි යන මතය ඔවුන් තුල පවතියි. බලහත්කාරයෙන් කඩවල පැමිණි මුදල් ඉල්ලයි.මේ සඳහා මහේෂ් මන්ත්‍රීතුමන් සම්බන්ධ නොවන බව ප්‍රකාශ කරන ලදි. මෙවන්වූ අසාධාරණකම් කිරීම කිසිසේත් නොගැලපෙන බව ප්‍රකාශ කරන ලදි.

<u>මහේෂ් මන්ත්‍රීතුමා</u>

මොන පක්ෂයකින් හෝ ව්‍යාපාරික ස්ථානවලින් මුදල් ලබා ගන්නා බව බන්දුල මන්ත්‍රීතුමන් පිළිගනියි. මන්ත්‍රීතුමන් දුටුදේ ප්‍රකාශ කල බව සඳහන් කරන ලදි.

<u>උදය බන්දුල මන්ත්‍රීතුමා</u>

සභාපතිතුමන් හොඳ තීරණයක් ගන්න. මන්ත්‍රීතුමන්ලාට එක් මන්ත්‍රී ධූරයක් හෝ මන්ත්‍රී ධූර එකහමාරක් හරි ලබා දුනහොත් ඒ අවස්ථාවට කල යුතුදේ කරන බව ප්‍රකාශ කරන ලදි. නමුත් මෙවන්වූ අසාධාරණකම් නොකරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව උක්ත යෝජනාව සම්බන්ධයෙන් දීර්ග ලෙස සාකච්ඡා කල සභාව මැතිවරණ රැලි පැවැත්වීම මහජන ක්‍රීඩාංගනය තුල පමණක් පැවැත්වීම සම්බන්ධයෙන්වූ යෝජනාව සඳහා ගරු මන්ත්‍රී ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමන් පමණක් විරුද්ධත්වය ප්‍රකාශ කල අතර, සෙසු ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත උක්ත යෝජනාව සභා සම්මතවීය.

**<u>05.07.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - ගලි බවුසරයට මෝටරයක් සවි කිරීම</u>**

මැදගම ප්‍රාදේශීය සභාව සතු RW - 0921 අංක දරණ ගලි බවුසරයෙන් දැනට ජලය පමණක් ඉවත් කිරීමට හැකියාවක් පවතින අතර, ඝණ අපද්‍රව්‍ය ඉවත්කිරීමට හැකියාවක් නොපවතියි. එම ඝණ අපද්‍රව්‍ය ඉවත්කිරීම සඳහා මෝටරයක් සවිකල යුතුව පවතින අතර, එම මෝටරය සවි කිරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විවිධවූ අදහස් ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

සභාව සතු ගලි බවුසරයෙන් ජලය පමනයි ඉවත් කිරීමට හැකියාව තිබෙන්නේ සාමන්‍ය මෝටරයක් නිසා ඇතුලත ඇති ඝන ද්‍රව්‍ය ඇදීමට නොහැකියි. සභාවට අළුතින් ගලි බවුසරයක් ණය මුදලක්ද ලබාගෙන මිලදී ගැනීමට සිටියද පසුගිය කාලයේ පැවති අරගලකාරී තත්වය හේතුවෙන් එය මිලදී ගැනීමට නොහැකිවූ බව ප්‍රකාශ කරන ලදි. එනිසා දැනට පවතින ගලි බවුසරයට මෝටරයක් සවිකර ගැනීමට උත්සාහ කරන බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය

**<u>05.08.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - Kyocera ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම</u>**

මැදගම ප්‍රදේශීය සභාව සතු Kyocera ඡායා පිටපත් යන්ත්‍රය අක්‍රීයව පවතින බැවින් එම ඡායා පරීක්ෂා කර බලා නැවත අළුත්වැඩියා කර ගත යුතුව පවතින අතර, අදාළ ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - අර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**<u>05.09.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - වරිපනම් දේපළ සඳහා අංක තහඩු සකස් කර ගැනීම</u>**

මැදගම ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් දේපළ තක්සේරු කිරීමේදී වරිපනම් අංක අදාළ නිවෙස්වල, ගොඩනැගිලි වල ප්‍රධාන උළුවැස්සේ තීන්ත මගින් සලකුණු කර ඇත. එම උළුවහුවල තීන්ත ආලේප කිරීමේදී වරිපනම් අංක මැකීගොස් ඇත.මේ නිසා වරිපනම් අය කර ගැනීමේදී විශාල ගැටළුවක් මතුවී ඇත. එමනිසා ප්ලාස්ටික් වලින් හෝ වෙනයම් ද්‍රව්‍යකින් විධිමත් ලෙස හා අලංකාර ලෙස අංක සකසා අදාළ නිවෙස් හා ගොඩනැගිලිවල සවි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ආදායම් පරීක්ෂකතුමන් ඉල්ලීමක් කර ඇති අතර, අදාළ වරිපනම් අංක සඳහා තහඩුවක් හෝ ප්ලාස්ටික් අංකයක් නිර්මාණය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - කේ.එම්.ජයසුන්දර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය

**<u>05.10.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - සභා දේපළ සඳහා සකස් කරන ලද ගිවිසුම් පත්‍රය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම</u>**

මැදගම ප්‍රාදේශීය සභාව සතු දීර්ඝකාලීනව බදු දෙන සභා දේපල සඳහා ඉදිරි වසර 03 කාලය සඳහා බදු දීමට අදාල ගිවිසුම් පත්‍රය සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

## මැදගම ප්‍රාදේශීය සභාව

**........................................................................................................**

**<u>කඩ කාමර බදු දීමේ ගිවිසුම් පත්‍රය.</u>**

මෙහි මින්මතු “බදු දීමනාකාර පාර්ශවය”වශයෙන් හඳුන්වනු ලබන යන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනත යටතේ සංස්ථාපිත මැදගම ප්‍රාදේශිය සභාව (අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් සමග) එක් පාර්ශවයකටද,

මෙහි මින්මතු“බදු ගැනුම්කාර පාර්ශවය” වශයෙන් හඳුන්වනු ලබන ............................................................................................................................................................ ............................. යන ලිපිනයෙහි පදිංචි ............................................................................................................................................................ .............................(ජාතික හැඳුනුම්පත් අංක.............................) යන අය (ඔහුගේ අනුප්‍රාප්තිකයන්,උරුමකරුවන්, පොල්මඃකරුවන්ද)යන අය අනෙක් පාර්ශවයටද වශයෙන් එහි දෙපාර්ශවය අතර වර්ෂ ...................ක්වූ...................මස.....................වන දින ඇතිකරගන්නට යෙදෙන බදු ගිවිසුමයි.

ඉහත කී බදු දීමනාකාර පක්ෂයට අයත්, නිරවුල්ව භුක්තිවිඳගෙන එනු ලබන ..............................................................................................................අංක.......දරන කඩ කාමරය (මෙහි මින්මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) මෙම බදු ගිවිසුමෙහි වලංගු කාල පරිච්ඡේදය වන වර්ෂ...........................වූ.......................මස................................වනදින සිට වර්ෂ..............වූ......................මස................ දින දක්වා ඉහත කී බදු ගැනුම්කාර පාර්ශවයට මෙහි මතු සඳහන් කොන්දේසිවලට යටත්ව බදු දීමට **වර්ෂ 2023 ක් වූ පෙබරවාරි 09 වනදින** අංක 5(10) දරන සභා සම්මුතිය යටතේ බදු දීමනාකාර පාර්ශවය තීරණය කර ඇති හෙයින්ද, එකී වර්ෂ...............ක්වූ...............මස..........දින සිට වර්ෂ...............ක්වූ..............මස................දින දක්වා කාල සීමාව සඳහා ඉහත විස්තර කරනු ලබන දේපළ සම්බන්ධයෙන් පළමු පාර්ශවයට ඇති නීත්‍යානුකූල අයිතිය පිළිගෙන මෙහි පහත පිළිගන්නට යෙදෙන කොන්දේසිවලට යටත්ව බදු ගැනීමට හා දැරීමටත් ඉහත කී බදු ගැනුම්කාර පාර්ශවය එකගව ඇති හෙයින්ද,

ඒ අනුව මෙම ගිවිසුම සහය කොටගනිමින් වර්ෂ 2023ක් වූ ජනවාරි මස 01 දින ආරම්භ වී වර්ෂ 2026ක්වූ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන ගිවිසුම් කාල සීමාව සඳහා මෙහි පහත සඳහන් පොරොන්දු ගිවිසිලිවලට යටත්ව ඉහත කී දෙපාර්ශවය මෙම ගිවිසුමට බැඳෙන්නාහ.

01. මෙම ගිවිසුමහි ගිවිසුම් කාලය වර්ෂ 2023ක්වූ.............මස.............දින ආරම්භ වී වර්ෂ..........ක්වූ...........මස..........දින අවසන් වෙයි.
02. වර්ෂ..........ක්වූ............මස...........දින ආරම්භ වී වර්ෂ...........ක්වූ............මස.............දින දක්වා කාලපරිච්ඡේදය සඳහා මාසිකව ගෙවිය යුතු බදු කුලී මුදල වන රු........................ ක මාසික කුලී මුදල හෝ මෙම ගිවිසුමෙහි කොන්දේසි ප්‍රකාරව අදාළ වන සංශෝධිත බදු කුලී මුදල හා ඊට අදාළව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු හා රජය විසින් කලින් කල පනවනු ලබන බදු මුදල් සමග ගිවිසුම් කාල සීමාව තුළ සෑම ලිත් මසකම 25 වෙනි දින හෝ එදිනට පෙර(මෙහි මින්මතු නියමිත දින යනුවෙන් හඳුන්වනු ලබන) බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත ගෙවිය යුතුය.
03. නියමිත දින ට ගෙවිය යුතු බදු කුළී මුදල් නොගෙවන හෝ පැහැරහරින විටකදී මාසික බදු කුළී මුදල සඳහා ඊට අතිරේකව මාසික කුලියෙන් සියයට දහයක (10%) මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත ගෙවිය යුතුය.
04. ගිවිසගනු ලබන ගිවිසුම් කාලය තුල මාසික බදු කුළීය සංශෝධනය වන්නේ නම් එම සංශෝධිත කුලිය එපරිද්දෙන්ම ගෙවිය යුතුය.
05. බදු ගැනුම්කරු විසින් මෙම ගිවිසුම ආරම්භ වන දිනෙන් ආරක්ෂක ඇප තැන්පත් මුදල් වශයෙන් මාස 03ක කාල සීමාවට අදාළ කුළී මුදලට සමාන රු. .................. මුදලක් බදු

දීමනාකරු වෙත ගෙවිය යුතුය.(කුලිය සංශෝධනය වීමකදී සංශෝධිත කුලියට අදාල ඉතිරි මුදල.)

06. ඉහත 5 වන වගන්තිය යටතේ ගෙවනු ලබන රු. .............. ක වූ ආරක්ෂක ඇප තැන්පත් මුදල් ගිවිසුම් කාල සීමාව තුල බදු ගැනුම්කරු විසින් හෝ ඔහුගේ බලයලත් අය වෙතින් මෙම ගිවිසුමට විෂයගත දේපළට අදාළව සිදුව ඇති අලාභහානි වෙතොත් ඒවාද බිල්පත් සඳහා වූ නොගෙවීම්, හිඟ පවත්නා කුළී මුදල් හා අතිරේකව දඩ මුදල් වෙතොත් ඒවාද අයකරගැනීමෙන් අනතුරුව ඉතිරිවන මුදලක් ඇත්නම් ගිවිසුම අවසන් වී මාසයක කාල සීමාවක් තුළ බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු වෙත ගෙවිය යුතු අතර

07. බදු ගැනුම්කරු බදු දීමනාකරුගේ පූර්ව ලිඛිත එකගතාවය ලබා ගැනීමකින් තොරව, මෙම ගිවිසුමට විෂයගත වන දේපළ හෝ ඉන් කවර කොටසක් හෝ වෙනත් පාර්ශවයකට ව්‍යාපාරය කරගෙන යාමට අවසර දීම; අතුරු බදු දීම හෝ කුළියට දීම හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම, හෝ අන්සතු කිරීම නොකළ යුතුය.

08. බදු ගැනුම්කරු පරිශ්‍රයට අදාළව බදු කාල සීමාව තුළ ගෙවිය යුතු බිල්පත් නිසි ආකාරයෙන් ගෙවීම් කර, ඊට අදාළ සෑම රිසිට්පතකම ඡායාපිටපතක් බදු දීමනාකරු වෙත ගෙවීම් කළ වහාම ඉදිරිපත් කළ යුතු අතර, බදු කාළ සීමාව අවසන් වීමෙන් පසුව වුවදබදු කාල සීමාවට අදාළව ගෙවීම් කළ යුතු බිල්පත් වේ නම් ඒ සෑම බිල්පතක් සඳහා බදු ගැනුම්කරු විසින් ඊට අදාළ ගෙවීම් කළ යුතුය.

09. බදු ගැනුම්කරු විසින් පරිශ්‍රයට අදාළව එක් රැස්වන කසළ ඝන අපද්‍රව්‍ය නිසියාකාරයෙන් බැහැර කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් සකසා පවත්වාගත යුතු අතර, පරිශ්‍රයහි කසළ හෝ අපද්‍රව්‍ය තාවකාලිකව හෝ ගබඩා කිරීම, පොදු ස්ථානයට බැහැර කිරීම හෝ නොකළ යුතුය.පරිශ්‍රයේ එක්රැස් වන කැළි කසල බදු දීමනාකරු විසින් ක්‍රියාත්මක කරන නිසි කළමනාකරණ යාන්ත්‍රනයකට අනුගත විය යුතුය.

10. මෙම ගිවිසුමට අදාළ පරිශ්‍රයහි කිසිදු ව්‍යුහගත වෙනස් කිරීමක් බදු දීමනාකරුගේ ලිඛිත අනුමැතියෙන් තොරව බදු ගැනුම්කරු විසින් නොකළ යුතු අතර, පරිශ්‍රය පවරාදෙනු ලබන තත්වයෙන්ම (සාධාරණ ක්ෂයවීම් හැර) මෙම ගිවිසුම අවසානයේ බදු දීමනාකරු වෙත පවරාදීමට හැකිවන පරිදි පවත්වාගෙන යාම උදෙසා සියළු පියවර බදු ගැනුම්කරු විසින් ගත යුතුය.

11. පරිශ්‍රයහි රුපියල් 10000/= ක වටිනාකම ඉක්මවන අළුත්වැඩියාවන් බදු දීමනාකරු විසින්ද; රු.10000/= හෝ ඊට අඩු වටිනාකම් ඇති අළුත්වැඩියාවන් බදු දීමනාකරුගේ එකඟතාවය ඇතිව බදු ගැනුම්කරු විසින් සිදු කළ යුතුය.

12. පරිශ්‍රය සඳහා ගෙවිය යුතු මාසික බදු කුළී මුදලට අතිරේඛව සභාව විසින් පනවනු ලබන වාර්ෂික වරිපනම් සඳහා බදු ගැනුම්කරු යටතේ විය යුතු අතර බදු කාල සීමාව සඳහා අදාළ වන වරිපනම් සභාව නමින් නිසි ආකාරයෙන් බදු දීමනාකරු වෙත ගෙවිය යුතුය.

13. පරිශ්‍රය ව්‍යාපාරයක් වන විටකදී ව්‍යාපාරය හඳුන්වාදීම සඳහා සවි කරනු ලබන නාම පුවරු වෙනත් පරිශ්‍රයකට අවහිර වන පරිදි සවි කිරීම නොකළ යුතු අතර පරිශ්‍රයෙහිසවි කරනු ලබන වෙලද භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරනයකින් තොරව තමා විසින් සකසන ලද එක් දැන්වීම් පුවරුවක් පමනක් දැන්වීම් පුවරු සම්බන්ධයෙන් බල පවත්නා ලිඛිත නීතියකින් අදාළ වන අවසර පත්‍රයක් ක්‍රියාත්මක කිරීමේදී නියමිත අවසර පත්‍ර ගාස්තුවෙන් නිදහස් වූවා සේ සැළකිය යුතුය.

14. මෙම ගිවිසුම යටතේ උපලේඛණයෙහි නිශ්චිතව විස්තර කරනු ලබන පරිශ්‍රය හැර බදුදීමනාකරුට අයත් වෙනත් පොදු බිම්කඩක් පදික වේදිකාවක් හෝ පොදු ප්‍රවේශයක්

ව්‍යාපාරයේ අවශ්‍යතාවය සඳහා ප්‍රයෝජනයට ගැනීම, සන්තකයට ගැනීම ප්‍රචාරණය සඳහා යොදා ගැනීම නොකළ යුතුය.

15. බදු ගැනුම්කරුගේ හෝ ඔහුගේ නියෝජිතයන්ගේ හෝ සේවකයන්ගේ ගනුදෙනුකරුවන්ගේ නොසැලකිළිමත්කම හේතුවෙන් පරිශ්‍රයෙහි කවර හෝ කොටසකට හෝ දේපළකට සිදුවන හානි සම්බන්ධයෙන් බදු ගැනුම්කරු වගකිව යුතුය.

16. බදු ගැනුම්කරු මෙම ගිවිසුමට අදාලපරිශ්‍රයහි ව්‍යාපාරික කටයුතු ආරම්භ කරයම් හෙයකින් ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට නොහැකි වේ නම් ඊට අදාළ සාධාරණ හේතු බදු දීමනාකරු වෙත ඉදිරිපත් කර අතිරේක කාලයක් ලබා ගත හැකි අතර එසේ ලබාදිය හැකි අතිරේක කාලය තවදුරටත් එක් මාසයක කාලයකට නොවැඩි විය යුතුය. මෙම වගන්තිය යටතේ ලබාදී ඇති කාල සීමාවන් ඇතුළත ව්‍යාපාරය ආරම්භ කිරීමට නොහැකි වී ඇති විටක තවදුරටත් එක් මාසයක කල් දීමකින් අනතුරුව ගිවිසුමට අදාළ කොන්දේසි කඩකළේය යන කරුණ මත මෙම ගිවිසුමඅවසන් කිරීමට බදු දීමනාකරු කටයුතු කළ යුතු අතර ගිවිසුම අවසන් කිරීම දක්වා වන කුළී මුදල් අයකිරීමට ක්‍රියා කළ යුතුය.

17. ගිවිසුම් කාල සීමාව තුළ පරිශ්‍රයෙහි ආරම්භව පැවති ව්‍යාපාරය සති තුනක් හෝ ඊට වැඩි කාලයක් බදු දීමනාකරුගේ ලිඛිත අනුමැතියකින් තොරව වසා තැබීම නොකළ යුතුය. එසේ වුවද එය වසා තිබෙන කාල සීමාව සඳහා මාසික කුළී මුදල් නිසි ආකාරයෙන් බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත ගෙවිය යුතුය.

18. බදු ගැනුම්කරු බදු කාල සීමාව තුල අනුගාමී මාස තුනක කාලයකදී මුදල් නියමිත දින හෝ එදිනට පෙර නොගෙවා ඇති විටෙක (ඒතාක් බදු දීමනාකරු කුළී මුදල් ඉල්ලා ඇත්තේ වුවද නොමැත්තේ වුවද) තවදුරටත් ඒ සඳහා දින 30ක කල් දීමකින් අනතුරුවදඅදාළ බදු කුළී මුදල් හා ඊට අදාළ පොළී මුදල් නොගෙවන්නේ නම් එසේ ලබා දෙන කාල සීමාව අවසානයේ මෙම ගිවිසුම අවසන් වුවා සේ සළකනු ලැබිය යුතු ය.

19. බදු කාල සීමාව තුළ හිඟ බදු කුළී නොගෙවීමට ක්‍රියාකරන ඕනෑම අවස්ථාවක බදු ගැනුම්කරුට අයත් චංචල දේපලක් බදු දීමනාකරුගේ බලයලත් නිලධාරියෙකු විසින් තහනමටගෙන විකුණා අයවිය යුතු බදු කුළී හා ඊට අදාළ ප්‍රමාද ගාස්තු බලපත්‍ර ක්‍රියාත්මක කිරීමෙහිලා යම් ගාස්තුවක් ඇත්නම් එය ද අයකර ගැනීමට බදු දීමනාකරුට ඇති අයිතිය බදු ගැනුම්කරු පිළිගනියි.

20. බදු ගැනුම්කරුගේ ක්‍රියාකාරකම හේතුවෙන් ඔහුගේ දේපලට වන හානි සම්බන්ධයෙන් බදු දීමනාකරු වගකීමට යටත් නොවන අතර එකී ක්‍රියාකාරකම් මත පරිශ්‍රයට වන හානි සම්බන්ධයෙන් හෝ අලාභ සම්බන්ධයෙන් බදු ගැනුම්කරු වගකිව යුතුය.

21. තවද එකී පරිශ්‍රයෙහි ව්‍යාපාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයකට වන අගතිය සම්බන්ධයෙන් බදු දීමනාකරු කිසිඳු වගකීමකට යටත් නොවේ.

22. බදු කාල සීමාව අවසන් වීමෙන් පසු හෝ මෙම ගිවිසුමෙහි කොන්දේසි උල්ලංඝනය කිරීම යන කරුණ මතම ගිවිසුම අවසන් කිරීමේදී පරිශ්‍රය බදු ගැනුම්කරු වෙත භාර දුන් පරිදි බදු දීමනාකරුගේ බලයලත් නියෝජිතයෙකු, නිලධාරියෙකු වෙත සාමකාමීව පරිශ්‍රයෙහි ශුන්‍ය සන්තකය බදු ගැනුම්කරු විසින් භාර දීම කළ යුතු ය. බදු ගැනුම්කරු එසේ ක්‍රියාකිරීමට අපොහොසත් වුවහොත් ශුන්‍ය සන්තකය භාර දීම දක්වා වන සෑම දිනයක් වෙනුවෙන් රුපියල් .......... ක මුදලක් (මසකට අදාළ කුළී මුදලින් 1/30ක මුදලක් දිනක් සඳහා වන පරිදි)බදු ගැනුම්කරු බදු දීමනාකරු වෙත ගෙවිය යුතු ය.

23. බදු ගැනුම්කරු පරිශ්‍රයට අදාළව යොදවනසේවකයින්, නියෝජිතයින් පිළිබඳ නාමලේඛණයක් බදු දීමනාකරු වෙත දිය යුතු අතර, එය වෙනස් වන සෑම අවස්ථාවකම වෙනස්වීම පිළිබඳව ලිඛිතව බදු දිමනාකරු දැනුවත් කළ යුතු ය.

24. යම් හෙයකින් බදු ගැනුම්කරුගේ ලිපිනයෙහි වෙනසක් වෙතොත් ඒ බව වෙනස සිදුවී දින 7 ක් ඇතුළත බදු දීමනාකරු වෙත දැනුම්දිය යුතු ය. නැතහොත් මෙම ගිවිසුම යටතේ දෙපාර්ශවය විසින් හුවමාරු කළ යුතු සියළුම ලියවිලි මෙම ගිවිසුමෙහි සඳහන් ලිපිනයන් වෙත ලියාපදිංචි තැපැලෙන් තැපැල් කිරිමෙන් ප්‍රමාණවත් ලෙස භාර දුන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

25. මෙම ගිවිසුමෙහි කොන්දේසි නිසි ආකාරයට ක්‍රියාත්මක කරමින් සිටියදී මෙම ගිවිසුම අවසන් වීමට පෙර බදු ගැනුම්කරු මියගියහොත් ගිවිසුමෙහි ඉතිරි කාල සීමාව සඳහා මෙම ගිවිසුම කොන්දේසි වලට යටත්ව බදු ගැනුම්කරුගේ කලත්‍රයාද, කලත්‍රයාද මිය ගොස් ඇති විටකදී බදු ගැනුම්කරුගේ සුජාත දරුවන්වද, දරුවන් ඇති විටක පහත ප්‍රමුඛතාවය සැලකිල්ලට ගනිමින් පරිශ්‍රය සඳහා බදුකරුවන් සැලකිය හැකිය.

පුත්‍රයන් (වයස අනුපිළිවෙලින්)

01..........................................................................................

02..............................................................................................

03...............................................................................................

දියණියන් ( වයස අනුපිළිවෙලින්)

01..........................................................................................

02..........................................................................................

03..........................................................................................

26. මෙම ගිවිසුම ආරම්භ වී වසර ..... ක් ගතවීමෙන් අනතුරුව ගිවිසුමෙහි කවර පාර්ශවයක් වුවද අනෙක් පාර්ශවයට මාස 03ක් පූර්වයෙන් ලිඛිත දැනුම් දීමක් මත මෙම බදු ගිවිසුම අවසන් කළ හැකිය. ගිවිසුම් කාලය මාස 1ක කාලයක් ගත වන තෙක් මෙම වගන්තිය යටතේ ගිවිසුම අවසන් කිරීමක් බදු ගැනුම්කරුගේ කොන්දේසි කඩ කිරීමකදී හැර බදු දීමනා කරුගේ අවශ්‍යතාවය මත නොකළ යුතුය.

එසේ වුවද මෙම ගිවිසුමෙහි කුළී නොගෙවීම මත ගිවිසුම අවසන් කිරීමට බදු දීමනාකරුට ඇති අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන කොන්දේසීන්ට අගතියක් නොවන පරිදි මෙම ගිවිසුමෙහි සඳහන් වෙනත් කවර හෝ කොන්දේසියක් බදු ගැනුම්කරු විසින් කඩකරයි නම් එම කවර හෝ අවස්ථාවකදී බදු ගැනුම්කරු ගිවිසුමට අනුකූල නොවන්නේ නම් තව දුරටත් දින 30ක කාලයක් කල් දීමකින් අනතුරුව බදු දීමනාකරුට මෙම ගිවිසුම අවසන් කිරීමට ඇති අයිතිය බදු ගැනුම්කරු පිළිගනී.

27. බදු ගැනුම්කරු මෙම ගිවිසුමෙහි ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීම සම්බන්ධයෙන් උනන්දුවක් වේ නම් ඒ සඳහා වන ඉල්ලීමක් ගිවිසුමෙහි ගිවිසුම් කාලය අවසන් විමට මාස තුනකට පෙර බදු දීමනාකරු වෙත ඉදිරිපත් කළ යුතු ය.

28. මෙම ගිවිසුමෙහි ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට බදු දීමනාකරු තීරණය කරන විට, දීර්ඝ කරනු ලබන කාලය සඳහා වන බදු කුලී මුදල රජයේ තක්සේරුව මත තීරණය කළ යුතු ය.

29. මෙම ගිවිසුමට අදාළ පරිශ්‍රයෙහි උරුමය පිළිබඳ අන්තිම කැමති පත්‍රයෙන් වෙනත් පාර්ශවයකට ප්‍රදානය කර ඇති අවස්ථාවක, එකී අන්තිම කැමති පත්‍රයේ අභිලාෂය ඉෂ්ඨ කිරීමට බදු දීමනාකරු යටත් නොවේ.

30. බදු කාල සීමාව තුල දවසේ සාධාරණ වේලාවකදී බදු දීමනාකරුගේ බලය ලත් නියෝජිතයකු මෙම ගිවිසුමට අනුකූලව කටයුතු පවත්වාගෙන යන්නේද යන අරමුණින් පරිශ්‍රයට ඇතුල් වී පරික්ෂා කිරීමේ ආදී කටයුතු කිරීමට ඇති අයිතිය බදු ගැනුම්කරු පිළිගනී.

ඉහත කී දෙපාර්ශවය මෙම පොරොන්දු ගිවිසිලි නියමයන්ට එකඟවන බව ප්‍රකාශිතව පිළිගනිමින් කෙලින්වීදිය,මැදගමලිපිනය ඇති බදු දීමනාකාර පාර්ශවයට අයත් මැදගම ප්‍රාදේශීය සභා

කාර්යාලයේ දී වර්ෂ ..... ක් වූ ................ මස ........ දින මෙය හා මේ හා සමාන තවත් ලියවිලි එකකට බදු දීමනාකරු වෙනුවෙන් පොදු මුද්‍රාව තබා සභාපති/ සභාලේකම් විසින් ද, බදු ගැනුම්කරු විසින් සිය අත්සන තබා සාක්ෂිකරුවන් දෙදෙනෙකු දඅත්සන් තබයි.

සභාපති | සභා ලේකම් | බදු ගැනුම්කරු
මැදගම ප්‍රාදේශීය සභාව | මැදගම ප්‍රාදේශීය සභාව
සාක්ෂි

නම | ලිපිනය | ජා: හැ: අංකය
අත්සන

1. .................................. .......................................... .............................
   .................................. ..........................................
2. ................................ ........................................ ............................ .
   .................................. ...............................................

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**05.11.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා**

**යෝජනාව : - ගමන් වියදම් දීමනාව ලබා ගැනීම සම්බන්ධවයි.**

ආදායම් පරීක්ෂක ඩබ්.ඒ.අතුල සමන් කුමාර මහතාට ගමන් වියදම් ලෙස සංයුක්ත දීමනා 05 ක් ලබා දෙනු ලබන බවත්, නිරන්තරයෙන් ක්ෂේත්‍රයේ ගමන් කිරීමට සිදුවීම නිසා සහ දැනට පවතින ඉන්ධන මිල ගණන් වැඩිවීම නිසා ලැබෙන මුදල ප්‍රමාණවත් නොවන බවත්, දන්වා සංයුක්ත දීමනා 06 ක් හා මසකට කිලෝමීටර් 1000 ක් සදහා එක් කිලෝමීටරයකට රුපියල් 02 ක බැගින්වූ දීමනාවක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති අතර, අදාල ගෙවීම සම්බන්ධයෙන් සභාවේ තීරණයක් ලබා ගැනීමට යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**05.12.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා**

**යෝජනාව : - මැදගම සතිපොළ කඩ කාමර බදුදීම.**

මැදගම ප්‍රාදේශීය සභාව සතු සතිපොළ භූමියේ ඉදිකර ඇති ගොඩනැගිලි 03 ක ඉතිරිව පවතින කඩ කාමර 03 ක් තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී තක්සේරු කර අදාල තක්සේරු වාර්තාව සභාව වෙත ලබාගෙන ඇත. එම තක්සේරු වාර්තාවට හා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව වසර 03 ක කාලයක් සදහා පහත උප ලේඛනවල සදහන් පරිදි ප්‍රසම්පාදනය කර බදු දීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

<u>කොන්ක්‍රීට් වහලය සහිත සතිපොළ නව ගොඩනැගිල්ලේ කඩ කාමරය</u>

| කඩ කාමර අංකය | අවම ලන්සුව | මාසික කුලිය |
|---|---|---|

| | | |
|---|---|---|
| 10 | 50000.00 | 9000.00 |

මැදගම සතිපොළ මස් කඩ, මාළු කඩ නව ගොඩනැගිල්ල ( කරවල කඩයක් සදහා)

| කඩ කාමර අංකය | අවම ලන්සුව | මාසික කුලිය |
|---|---|---|
| 03 | 50000.00 | 9000.00 |

මැදගම සතිපොළ පැරණි ගොඩනැගිල්ල (පැරණි මාළු කඩයට යාබද කඩ කාමරය)

| කඩ කාමර අංකය | අවම ලන්සුව | මාසික කුලිය |
|---|---|---|
| 11 | 50000.00 | 3000.00 |

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විවිධවූ අදහස් ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා

සතිපොළ මස් කඩ මාළුකඩ නව ගොඩනැගිල්ල තුල ඇති කඩ කාමරය මුහුදු කරවල වැනි වියලි ආහාර විකිණීමට ලබාදීමට අදහස් කර ඇති බව ප්‍රකාශ කරන ලදි.

ෂබ්රි මන්ත්‍රීතුමා

එම අදහස හොදවේ. නැත්නම් කඩ කාමරය රුපියල් 10000 /5000 ට ලබාදීමෙන් කිසිදු පලක් නොමැත. එවන්වූ කතාවක් මිනිසුන් අතර, ප්‍රචාරය වන බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා

එසේ කඩ කාමරය ලබා ගැනීමට විවිධ කණ්ඩායම් උත්සාහ කලා. එළුමස් කඩයට රු.5000.00 ක් ගෙවා ලබා ගැනීමට උත්සාහ කල බවත්, එය නවත්වා ප්‍රසම්පාදනය කිරීමට තීරණය කල බව ප්‍රකාශ කරන ලදි.

නිමල් මන්ත්‍රීතුමා

ප්‍රසම්පාදන ක්‍රමවේදයට කඩය බදු දීමට බදුකරුවෙකු තෝරා ගන්නේද විමසීමක් කරන ලදි. ගිවිසුම් කාලය අවසන්වූ පසු බදුකරු වෙනස් වන්නේද?

ගරු සභාපතිතුමා

අවුරුදු 03 ක කාලයක් සදහා ගිවිසුම් අත්සන් කරයි. අවුරුද්දෙන් අවුරුද්ද වෙනස් නොකරයි.

මහේෂ් මන්ත්‍රීතුමා

මාසික කුලිය 9000.00 ක් ද යතුරු ගාස්තුව රු. 50000.00 ක්ද විමසීමක් කරන ලදි.

ගරු සභාපතිතුමා

මාසික කුලිය 9000.00 කි. යතුරු ගාස්තුව 50000.00 කි. යතුරු ගාස්තු මුදල වැඩි විය හැකියි. අවම ලන්සු මුදල ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීමෙන් වෙනස් විය හැකියි.

ෂබ්රි මන්ත්‍රීතුමා

අවුරුදු 03 ක කාලයක් සදහා මාසික ගාස්තුව 9000.00 ක් යතුරු ගාස්තුව 50000.00 කි. අවුරුදු 03 කින් පසු මෙම ගාස්තු දෙකම වෙනස් වන්නේද විමසීමක් කරන ලදි.

ගරු සභාපතිතුමා

වසර 05 කින් පසු බදු කුළිය පමණක් වෙනස් වේ. අවුරුදු 03 කින් පසු අදාල පුද්ගලයාටම කඩය පවත්වාගෙන යාමට හැකියාව තිබේ. නමුත් කුලී මුදල වෙනස් වේ. මෙතෙක් කාලයක් සිදුකරගෙන යන ක්‍රමවේදය එය වන බව ප්‍රකාශ කරන ලදි.

ෂබ්රි මන්ත්‍රීතුමා

කුලී මුදල් වෙනස් නොකර දිගටම එකම බදුකරුවෙකුට කඩය භාර දුනහොත් එම කඩය ඔහුටම දුන්නා කියා සිතයි. ඒ ක්‍රමවේදය වෙනස් කල යුතුයි.

නිමල් මන්ත්‍රීතුමා
අවුරුද්දෙන් අවුරුද්ද ටෙන්ඩර් කිරීමට හැකියාවක් තිබේද විමසීමක් කරන ලදි.
ෂබ්රි මන්ත්‍රීතුමා
මස් කඩ මාළු කඩ ටෙන්ඩර් කරන ආකාරයට ස්ථිර කඩ ටෙන්ඩර් කිරීමට හැකියාවක් නැත.
බන්දුල මන්ත්‍රීතුමා
මෙම කඩ පමණක් අවුරුදු 03 කට ටෙන්ඩර් කරන්නේ ඇයි.අනෙක් කඩ එසේ ටෙන්ඩර් නොකරයි.
ගරු සභාපතිතුමා
සියළු කඩ වසර 03 කට වරක් ප්‍රසම්පාදය කර නව ගිවිසුම් අත්සන් කරණු ලබයි.

ඒ අනුව ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**05.13.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා**

**යෝජනාව :- අතුරු ව්‍යවස්ථා පැනවීම**

මැදගම ප්‍රාදේශීය සභාව මගින් ප්‍රාදේශීය සභා පනතේ නම් නොකල සේවාවන් දැනට පවත්වා ගෙන යනු ලබන අතර,එම සේවාවන් විධිමත් කිරීම,පරිපාලනය කිරීම හා ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වුවත් මේවන තෙක්ම පනවාගෙන නොමැත. එමෙන්ම දැනට පවත්වාගෙන යනු ලබන ඇතැම් සම්මත අතුරු ව්‍යවස්ථා වසර 30 කට වඩා පැරණි ඒවා නිසා වර්තමාන කාලයට නොගැලපෙන තත්වයක් උදාවී ඇත. එබැවින් වර්තමාන කාලයට ගැලපෙන අයුරින් පහත සඳහන් අතුරු ව්‍යවස්ථා සභාව මගින් සකසා ගැනීම සුදුසු වන බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

01.ළමා උද්‍යානය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
02.බේකරි පිළිබඳ අතරු ව්‍යවස්ථාව
03.ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීම / ඉඩම් කට්ටි සැලසුම් අනුමත කර ගැනීම
04.ත්‍රී රෝද නැවතුම්පළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
05.කුකුල් ඝාතකාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
06.යන්ත්‍රෝපකරණ කුලියට දීම පිළිබඳ අතුරු ව්‍යවස්තාව
07.ජල සේවා ලබාදීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය

**05.14.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා**

**යෝජනාව :- HNB මුදල් තැන්පතු / ආපසු ලබා ගැනීමේ යන්ත්‍රයක් සවිකිරීම සඳහා අවසර ලබාදීම**

මැදගම ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාලය ඉදිරිපිට කොටසෙහි පෞද්ගලික බැංකුවක් වන හැටන් නැෂනල් බැංකුවේ මුදල් තැන්පතු හා ආපසු ගැනීම් යන්ත්‍රයක් සවි කිරීම සඳහා අඩි 10 ‹ 10 බිම් කොටසක් ලබාදෙන ලෙසට මාගෙන් ඉල්ලීම් කර ඇති අතර, අදාල බිම් කොටස ලබාදී මුදල් තැන්පතු හා ආපසු ගැනීම් යන්ත්‍රයක් සවි කිරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.
යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - කේ.එම්.ජයසුන්දර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය

**05.15.යෝජනාකරු:- රංජිත් පියදිගම මැතිතුමා**

**යෝජනාව :- ළමා උද්‍යානයේ බෝට්ටු අංගනයක් සකස් කිරීම.**

මැදගම ප්‍රාදේශීය සභාව මගින් සංවර්ධන කටයුතු සිදුකරමින් පවතින මැදගම ළමා උද්‍යානයේ කුඩා දරුවන් සඳහා ජල ක්‍රීඩා කිරීම වෙනුවෙන් බෝට්ටු අංගනයක් සකස් කිරීමට සැලසුම් කර ඇති අතර, එවන් නිර්මාණයක් තුලින් විනෝදවන දරුවන් සඳහා මනා තෘප්තියක් ලැබීමට ඉඩකඩ සලසා දිය හැකිය. එබැවින් ළමා උද්‍යානය තුල බෝට්ටු අංගනයක් සකස් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථීරත්වය :- ගරු මන්ත්‍රී - ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය

**06. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම :-** නැත

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශනය :-**

2023 ජනවාරි මාසයට අදාළ ආදායම් වියදම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට
යෝජනාව :- ගරු මන්ත්‍රී - කේ.එම්.ජයසුන්දර මැතිතුමා
යෝජනා ස්ථිරත්ව :- ගරු මන්ත්‍රී - ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් 2023 ජනවාරි මාසයට අදාල ආදායම් වියදම් සාරාංශ සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලදි. එහිදී ගරු මන්ත්‍රී උදය බන්දු මැතිතුමන් 2023 ජනවාරි මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කර බෙදුමක් ඉල්ලා සිටින ලදි. එම අවස්ථාවේ ගරු මන්ත්‍රී - ඩබ්.එම්. උදය බන්දුල මැතිතුමන් කළ යෝජනාව සම්බන්ධයෙන් සෙසු ගරු මන්ත්‍රී මණ්ඩලය එකඟත්වය පල නොකල බැවින් 2023 ජනවාරි මාසයට අදාළ ආදායම් වියදම් වාර්තාව සඳහා ගරු මන්ත්‍රී - ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමන්ගේ විරුද්ධත්වය සටහන් කරගත් අතර, සෙසු ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත ආදායම් වියදම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභා සම්මත කර ගන්නා ලදි.

**08.හදිසි කරුණු හා වෙනත් කරුණු**

08.01.ක්‍රීඩාපිටිය අසල මත්ද්‍රව්‍ය භාවිත කිරීම වැලැක්වී (ගරු මන්ත්‍රී - නිමල් සරත් කුමාර මැතිතුමා)

මැදගම මහජන ක්‍රීඩාංගනය අසල සෑම දිනකම සවස් කාලයේ මත්පැන් පානය කරයි. එවිට එම ස්ථානයෙන් කිසිවෙකුට ගමන් කල නොහැකි තත්වයක් උදාවී තිබේ. පසුගිය දිනක නිමල් මන්ත්‍රීතුමන්ටද ගැටළුවක් ඇතිවූ බව ප්‍රකාශ කරන ලදි. එනිසා ඒ සඳහා විසඳුමක් ගතයුතු බව සඳහන් කරන ලදි.පසුගිය කාලය තුල සිදුවූ සොරකම් කිහිපයකට මොවුන් සම්බන්ධ බව ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදි. නගරයේ මත්පැන් බොන ස්ථාන පොලීසියෙන් වැටලීම් කලත්

ක්‍රීඩා පිටියේ කිසිදු පරීක්ෂාවක් සිදු නොකරයි. එම ස්ථානය අවට මත්පැන් බොන පිරිස් බෝතල් විශාල ප්‍රමාණයක් දමා ගොස් තිබේ.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධයෙන් පොලීසි දැනුවත් කරන ලෙසට ගරු සභාපතිතුමන් සහා ලේකම්තුමා වෙත උපදෙස් ලබාදෙන ලදි.

**08.02.කඩකාමර සදහා ලබා ගන්නා ඇපතැම්පත් මුදල් සම්බන්ධවයි.**

ෂබ්රි මන්ත්‍රීතුමා

මැදගම සතිපොළ භූමියේ ඉදිකර ඇති කඩකාමර සදහා අයකරන ඇපතැම්පත් මුදල රු.50000.00 ක මුදලක් ගෙවීමට තිබේ. එම මුදල ලක්ෂ 50 ක් පමණ වුවහොත් ඒ මුදල ව්‍යාපාරිකයා කෙසේ ගෙවන්නේද?

ගරු සභාපතිතුමා

කඩ කාමර කුලියට ලබාදීමේදී සෑම තැනකම සිදු කරන ආකාරයට යතුරු ගාස්තුව ලෙස මුදලක් ලබා ගනියි. එය නැවත ගෙවීමක් සිදු නොකරයි. එය සභාවේ ලැබීමකි. එයට වැඩි මුදලක් ලන්සු ලෙස ඉදිරිපත් කල පසු වැඩියෙන්ම ඉල්ලන මුදල සදහා කඩකාමර ලබාදෙයි.

ෂබ්රි මන්ත්‍රීතුමා

50000.00 ක ඇපතැම්පත් මුදල නැවත ලබා නොදෙයි. ලන්සු මුදල වැඩි විය හැකියි. අවම වශයෙන් ලක්ෂ 50 කටවත් ලන්සු මුදල වැඩිවිය හැකියි. ඒ අය කෙසේ එම ඇපතැම්පත් මුදල ගෙවන්නද?

ගරු සභාපතිතුමා

එම මුදල එවෙලේ ගෙවිය යුතුයි.මුදල ගෙවා ගිවිසුම් අත්සන් කල යුතු බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. හෙට දිනයේ සිට ප්‍රසම්පාදනය කැදවනු ලබන අතර, මන්ත්‍රීතුමන්ලා ඒ පිලිබදව දැනුවත් කරන්න. එයට අමතරව කඩ කිහිපය ඉදිරිපිටද දැන්වීමක් පල කරන බවත්, පුවත්පත් දැන්වීමක්ද පල කරන බව ප්‍රකාශ කරන ලදි.

**08.03. මස්කඩ හා මාළු කඩ පවතින ස්ථානය ජලය බැසයාමට පහසු පරිදි සකස් කිරීම(එම්.ඒ.එම්.ෂබ්රි මැතිතුමා)**

මස්කඩ මාළු කඩවලින් ඉවත්වන ජලය එම ස්ථානයේ රැදෙන නිසා ඒ අවට විශාල දුර්ගන්ධයක් පවතියි. එනිසා එම ස්ථානයට ග්‍රැවල් තට්ටුවක් හෝ යොදා ජලය බැස යාමට පහසුවන පරිදි එම ස්ථානය සකස් කරන ලෙසට ගරු සභාපතිතුමන්ගෙන් ඉල්ලීමක් කරන ලදි.

**09.ගරු මන්ත්‍රීතුමන්ලා / ගරු මන්ත්‍රීතුමියන්ලා විසින් අදහස් හා යෝජනා ප්‍රකාශ කිරීම :-**

**09.01.ගරු මන්ත්‍රී - ජේ.ජී.නිමල් සරත් කුමාර මැතිතුමා**

ගරු මන්ත්‍රී ජේ.ජී.නිමල් සරත් කුමාර මැතිතුමන් සභාවට අදහස් දක්වමින්, මැතිවරණයකට නාම යෝජනා භාර ගෙන දැනට මාසයකට එකහමාරකට වැඩි කාලයක් වේ. මන්ත්‍රීතුමන් වසර 20 කට වැඩි කාලයක් ගරු සභාපතිතුමා සමඟත් මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කල බව ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමන්ලා වේදිකාවේ මොනදේ කතා කලත් ජයග්‍රහණය කර වේදිකාවෙන් බැස්ස පසු සභාවට පැමින සහයෝගයෙන් වැඩ කිරීමට සිදුවේ. දැනට සිටින මන්ත්‍රී මණ්ඩලයත් සමඟ දීර්ග කාලයක් බොහොමත්ම සුහදව වැඩකටයුතු සිදුකල බව සදහන් කරන ලදි. එසේම ගරු සභාපතිතුමන් ලබාගත් හොද තීරණ පිටුපස මන්ත්‍රීතුමන් සෑම අවස්ථාවකම සිටි බව ප්‍රකාශ කරන ලදි. මොනම අවස්ථාවකදීවත් ඒ සදහා විරුද්ධ නොවූ බව ප්‍රකාශ කරන ලදි. සභාව තුල සිදුවන අදහස් ප්‍රකාශ කිරීම් එම ස්ථානයෙන් ඉවත්ව යන විට තබා යයි. එයින් පිටතදී ඒ හිත් අමනාපකම් තබාගෙන නොසිටින බව පෙන්වා දෙන ලදි. මන්ත්‍රීතුමන්ට සභාපතිතුමන්ගේත් මන්ත්‍රී මණ්ඩලයේත් ගෞරවය උදව් උපකාර නොඅඩුව හිමිවූ බවත්, මීට පෙර සභාවේ සිටි

ලේකම්තුමාලාගෙනුත්, දැනට සිටින ලේකම්තුමන්ගෙනුත්, කාර්ය මණ්ඩලයෙනුත්,කම්කරු මහතුන්ගෙනුත් හොඳ සහයෝගයක් ලබාදුන් අතර, මන්ත්‍රීතුමන් සමඟ ඉතා සුහදව කටයුතු කල බව සඳහන් කරන ලදි. බොහෝදුරට මන්ත්‍රීතුමන්ලාට ලබන සභාවට පැමිණීමට අවස්ථාවක් හිමිවිය නොහැකි වන බවත්, මන්ත්‍රීතුමන්ලා පක්ෂයෙන් නෙරපාහැරීමට ලිපි හුවමාරුවී තිබෙන බවත්, ප්‍රකාශ කරන ලදි. ඉදිරියේදී සභාවක් පිහිටවූවහොත් නවක මන්ත්‍රීවරු පත්වී පැමිනෙයි.

ඉදිරියේදී මැතිවරණ පැවතුනහොත් අවස්ථාවක් තිබිය හැකියි. මැතිවරණ වේදිකාවේ කතාබහ කරන්නේ මන්ත්‍රීතුමන්ලා නැවත සභාවට පැමිණෙන විට ගෙන එන්නේ නෑ. මන්ත්‍රීතුමන්ලා හැමදෙනාම සහෝදරයින් සේ කටයුතු කල බවත්, ඒවාගේම මැතිවරණ වලදීත් මොන මොන පක්ෂ නියෝජනය කලත් සියළු දෙනාම එකාමෙන් සිටිය යුතුයි. කල යුත්තේ මැතිවරණ ව්‍යාපාරය පමණි. පහර දීම් වෙනත් ගැටුම් ඇති නොකර සිටින ලෙසට යෝජනා කරන ලදි.

එසේම පොළේ ගැටළුවක් පවතියි. පොළ භූමිය ගරු සභාපතිතුමන් මැදිහත්වී ඉදිකල ගොඩනැගිල්ල තුල. සමහර වෙළඳුන් පොළ කුලිය ලෙස තවමත් රු. 500.00 ක මුදලක් ගෙවයි. එය අමතරව පිට අයටත් රුපියල් 1000.00 ක පමණ මුදලක් ගෙවයි. පොළටත් ගෙවා කඩකාමර කොටස සඳහාත් ගෙවිය යුතුවන නිසා එම මුදල් ප්‍රමානය ගෙවීම නොහැකි බව පවසමින් මැසිවිලි නගයි.

ඒවාගේම මීට පෙරත් සඳහන් කල පරිදි නගරයේ බොහෝ ස්ථානවල මත්පැන් පානය කරයි. ඒ හේතුවෙන් හොරකම් සිදුවනවාසේම ගැටුම්ද ඇතිවේ. එනිසා මේ සම්බන්ධයෙන් පොලීසිය දැනුවත් කරන ලෙසට ඉල්ලීමක් කරමින් ගරු මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>09.02.ගරු මන්ත්‍රී - එම්.ඒ.එම්.ෂබ්රි මැතිතුමා</u>**

ගරු මන්ත්‍රී එම්.ඒ.එම්.ෂබ්රි මැතිතුමන් සභාවට අදහස් දක්වමින්, ගරු මන්ත්‍රී නිමල් මැතිතුමන් සඳහන් කල පරිදි මන්ත්‍රීතුමන්ටද දින 07 ක් ඇතුලත කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වා පක්ෂයෙන් ලිපියක් ඉදිරිපත් කර ඇති බව මුලින්ම සඳහන් කරන ලදි. කරුණු ඉදරිපත් කරන්නේ කාටද කියාවත් මන්ත්‍රීතුමන්ලා නොදන්නා බවත් සඳහන් කරන ලදි. පක්ෂයේ ආසන නායක කවුද, පක්ෂයේ නායකයා කවුද, දිස්ත්‍රික් නායකයෝ කවුද මන්ත්‍රීතුමන්ලා පක්ෂයෙන් ඡන්දය ඉල්ලනවාද කියාවත් කිසිවකු විමසීමක් නොකල බව ප්‍රකාශ කරන ලදි. නාම යෝජනා භාර දෙන අවසාන මොහොතේ දැනුවත් කිරීමක් නොකල නිසයි සමගි ජනබලවේගය පක්ෂයෙන් ඡන්දය ඉල්ලීමට තීරණය කලේ. මොන පක්ෂයකින් හෝ ඡන්දය ඉල්ලිමට සිදුවන නිසයි සමගි ජනබලවේගයට එක්වූයේ. එහි කිසි ගැටළුවක් නොවන බවත්, ඉදිරි මාසයේ පැවැත්වෙන සභා රැස්වීමට මන්ත්‍රීතුමන්ලාට සහභාගීවීමට නොහැකි විය හැකි බවත්, පක්ෂයෙන් කවුරුන්හෝ පත්කර එවිය හැකැයි. කොට්ඨාශ ක්‍රමය නිසයි එය සිදුවන්නේ නැතිනම් එයත් සිදුනොවන බව ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමන්ලා කොට්ඨාශ ක්‍රමයෙන් මේ තත්වයට පැමිණි බවත්, එය රනිල් වික්‍රමසිංහ මහතාගේ පක්ෂයෙන්වත් වෙනත් කාගෙන්වත් ලැබුන දෙයක් නොව ෂබ්රි රාජාගේ, රසීදු ගේ ජයග්‍රහණයක් බව ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂයෙන් ඡන්දයට ඉදිරිපත්වීමට නොහැකිවීම පිළිබඳව කනගාටුවට පත්වන බව ප්‍රකාශ කරන ලදි.

එසේම ගරු මන්ත්‍රීතුමන් වසර 17 ක පමණ කාලයක් සභාවට පැමිණ විපක්ෂයේ වාඩිවී සිට හොඳ දේ ට ඇහුම්කන් දී ඒවාට සහයෝගය ලබාදී කටයුතු කිරීමට හැකිවීම ගැන සතුටට පත්වන බව ප්‍රකාශ කරන ලදි.සමහර අය හැමදේටම විරුද්ධත්වය ප්‍රකාශ කර වැසිකිළිවලට ගෙනඑන සේදුම් දියරවලිනුත් ගසාකන පුද්ගලයින් සිටින සමහර සභාවල මන්ත්‍රීතුමන් හොඳ දේට ඇහුම්කම් දී හොඳදේට සහයෝගය ලබාදි සභාවට පැමිණ තේ එකක් හා කෑම පැකට්ටුවක් පමණයි ලබාගෙන තිබෙන්නේ ඒ හැරුණුකොට කිසිවක් ලබාගෙන නොමැත. සමහර අවස්ථාවල ගමේ වැඩකටයුතු සඳහා උදවු කරන ලෙසට පැවසූවිට සභාපතිතුමන්ට මන්ත්‍රීතුමන් උදව් කරන නිසා

මන්ත්‍රීතුමන්ලාගේ ගමට යම් යම් උදව් උපකාර කර තිබේ. ඒ හැරුණු කොට කිසිවක් ලබාගෙන නැත. මන්ත්‍රීතුමන් එතුමන්ගේ මන්ත්‍රීකමෙන් ගමේ ජනතාවට කල හැකි සේවාව සිදුකර තිබෙන බව සදහන් කරන ලදි. ජනතාවත් ගරු මන්ත්‍රීතුමාත් ඒ පිළිබදව හොදින් දන්නා බව ප්‍රකාශ කරන ලදි.

ඒසේම ගරු සභාපතිතුමන් තීරණයක් ගෙන තිබෙනවා මැතිවරණ රැලි පැවැත්වීම සදහා ක්‍රීඩා පිටිය යොදා ගැනීමට .එය ලොකු අවාසියකි. මන්ත්‍රීතුමන් තුලත් ඒ සම්බන්ධයෙන් විරුද්ධත්වයක් තිබෙන නමුත් සභාපතිතුමා මේ මැදගම නගරයේ පළමු පුරවැසියා.ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනාධිපතිතුමන්ට රට පාලනය කිරීමට බලතල හිමිවනවාසේම සභාපතිතුමන්ට බල ප්‍රදේශයේ බලතල හිමිවේ. සභාපතිතුමන්ට ව්‍යාපාරිකයින් රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු යෝජනාවක් කලේ නම් නගරයේ රැස්වීම් පවත්වන්නට එපා කියා. ඒ සදහා එතුමන් කරන වැඩපිළිවෙලට මන්ත්‍රීතුමන්ලාට විරුද්ධවීමට හැකියාවක් නැත. විපක්ෂය ලෙස ඒ සදහා ආරක්ෂාව ලබා දීමට මන්ත්‍රීතුමන්ලාටද හැකියාවක් නැත. එය සභාපතිතුමන්ගේ තීරණයකි. මන්ත්‍රීතුමන්ටත් බස්නැවතුම්පල ලැබෙනවා නම් හොදයි. නමුත් පොදු තීරණයක් ගෙන ඇති නිසා අපද ක්‍රීඩා පිටියේ රැස්වීම් පැවැත්වීමට එකඟවන බව ප්‍රකාශ කරන ලදි.

එවාගේම අවුරුදු 17 ක කාලයක් මන්ත්‍රීතුමන් සභාවේ වැඩ කටයුතු සිදු කරනවිට සමහර මන්ත්‍රීතුමන්ලා අළුතින් පැමිණියා. නිමල් මන්ත්‍රීතුමා, ප්‍රේමපාල මන්ත්‍රීතුමා, මහේෂ් මන්ත්‍රීතුමා සියළුදෙනා එක්ව අවුරුදු 17 ක කාලයක් කටයුතු කල අතර, එසේ කටයුතු කරන කාලයතුල යම් යම් ප්‍රශ්න කතා කලත් මෙම ස්ථානයෙන් එළියට යනවිට ඒ සියල්ල අමතක කර සියළු දෙනා සහෝදරයින් ලෙස කටයුතු කල බව ප්‍රකාශ කරන ලදි. සභාවේ කතාබහ කරනදේ එම ස්ථානයේම අවසන් කල යුතුයි. ඒවා හිතේ තබාගෙන වෛරයෙන් කටයුතු නොකල යුතුයි. මන්ත්‍රීතුමන්ගෙන් යම් වරදක් සිදුවුණේ නම් සමාව ඉල්ලා සිටිමන් ගරු මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**09.03.ගරු මන්ත්‍රී - කේ.එම්.ජයසුන්දර මැතිතුමා**

ගරු මන්ත්‍රී කේ.එම්.ජයසුන්දර මැතිතුමන් සභාවට අදහස් දක්වමින්, මුලින්ම රජයට ස්තූතිය පුද කල යුතු බව ප්‍රකාශ කරන ලදි.මැතිවරණයෙන් පසු ප්‍රදේශයට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුට මුදලක් වෙන් කර තමන්ගේ කොට්ඨාශයට සංවර්ධනය ගෙනදීම වෙනුවෙන් ස්තූතිය පුද කරන බව සදහන් කරන ලදි.ඒතුලින් ගමට සිදුවූ සේවය වෙනුවෙන් හිටුප ජනාධිපතිතුමන්ට,අග්‍රාමාත්‍යතුමන් ඇතුළු කණ්ඩායමට විශේෂ ස්තූතියක් පුදකරන ලදි.

සමහර කණ්ඩායම් සභාවට අලුතින් පැමිණි බව පවසමින් සමච්චල් කරයි. නමුත් මන්ත්‍රීතුමන්ලා 2018 මැතිවරණයෙන් සභාවට පැමිණියද මැතිවරණ ව්‍යාපාරය ආරම්භ කලේ 1970 වර්ෂයේ සිට බව සදහන් කරන ලදි. 1970 වර්ෂයේ පක්ෂයට බැදී ක්‍රියාකාරීන් ලෙස ගම්වල ගොඩනගා ගන්නාලද තත්වය නිසායි 2018 පළාත් පාලන මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීමට හැකියාව ලැබුනේ. ගරු මන්ත්‍රීතුමන් 2006 වර්ෂයෙත් මැතිවරණයට ඉදිරිපත්වූ අතර, එම මැතිවරණයෙන් ජයග්‍රහණය කර සභාවට පැමිණීමට නොහැකිවූ බවත්, ජයග්‍රහණය කල මන්ත්‍රීතුමන්ට සභාවට පැමිණීමට නොහැකිවූ බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම මන්ත්‍රීතුමන් එක් එක් පක්ෂ වලින් බැටකාපු දේපළ විනාශ කල ඒවාට මුහුණ දුන් අය වන බව ප්‍රකාශ කරන ලදි.1989.02 .09 දින රාත්‍රී මන්ත්‍රීතුමන් සතුව තිබූ කඩ කාමර 03 කින් යුතු කඩකාමර පෙළ ගිණිතබා විනාශ කල බව සදහන් කරන ලදි. ඒ කාලවකුවානුව වන විට අලාභය ලක්ෂ 14 කට වැඩි ප්‍රමාණයක් විය. ඒ කාලයේ හැටියට මන්ත්‍රීතුමන්ගේ කඩයෙහි සවස් කාලය වන විට 04 දෙනකු පමණ බඩු ලබාදීමට සිටිය යුතුවේ. එම මාසයේම 27 වන දින රාත්‍රී 12.05 ට පමණ නිවසට පැමිණ නිවසේ මන්ත්‍රීතුමන් හා බිරිද පමණක් සිටි අතර, දරුවන් කොස් කබල්වල දමා ආරක්ෂා කර තිබූ බව ප්‍රකාශ කරන ලදි. එම අවස්ථාවේ නිවසට පැමිණ තුවක්කුවක් හිසට තබා මුදල් ඉල්ලූ බවත්, ප්‍රකාශ කරන ලදි. වරදක් නොකල නිසා මන්ත්රීතුමන්

බිය නොවී සිටිබවත් එතුමන්ගේ ඉහත ආත්මේ කල පිනකට එදා ජීවිතය බේරුන බව ප්‍රකාශ කරන ලදි. ඒකාලයේ කල වැඩ අමතකවූ පිරිස් එම පක්ෂයට බැඳුනද දන්නා පුද්ගලයින් කිසි දිනක එම පක්ෂයට බැඳෙන්නේ නැති බව සඳහන් කරන ලදි. ගවයෙක් මැරීමට,කුකුළෙක් මැරීමට බලපත්‍ර අවශ්‍ය වේ. නමුත් ඒ කාලයේ මංසංන්දියක් මංසන්දියක් ගානේ මිනිසුන් මරා හතරගාතින් එල්ලා තිබුණු යුගයක් පැවතුන බවත්,මන්ත්‍රීතුමන්ගේ ඥාතියකු බෝක්කු කණුවකට දා මරා අත කපාගෙන ගොස් තිබුණි. මරණය සිදුවූ විට දණහිසෙන් උඩට එසවිය නොහැකියි. ඒ තරමට තාඩනපීඩනවලට ලක්කරමිනුයි මිනිසුන් මරා තිබුණේ. එවන්වූ තාඩන පීඩනවලට ලක්වෙමින් මන්ත්‍රීතුමන්ලා මේ තත්වයට පැමිණියේ යනුවෙන් ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමන්ලා ජනතාව සමඟ සිටි නිසයි 2018 පළාත් පාලන මැතිවරණයෙන් ඡන්දය ලබාදී ජනතාව මෙතනට ගෙනආවේ. කිසිවෙකුටත් හිරිහැරයක් කරදරයක් නොකල නිසයි මේ තත්වයට පැමිණියේ. එසේ නොමැතිව උඩින් ඇවිත් පහත්වුනා නොවේ. සාධාරණව ජීවත්වුන නිසයි ජනතාව මන්ත්‍රීතුමන්ලා සමඟ රැඳෙන්නේ.

පසුගිය කාලයේ අරගලය කිරීම හේතුවෙන් සිදුවුයේ මිනිසුන් දහදුක් විඳලයි ගෙයක් දොරක් හදාගන්නේ. යමක් හම්බකර ගන්නේ. නිවරදිව වරදකරුවන් ලෙස හඳුනාගෙන එම දේපල වලට ගිනි තැබූයේ නම් ගැටළුවක් නොවන බවත්, එතරම් විනාශයක් කර රට පහතට ඇද දැමූ කණ්ඩායමක් දැන් රට හැදීමට සූදානම් වෙයි. ඔවුන් රට හදයිද. මේ සභාවට පත්වුවත් මාස 03 කට වැඩි කාලයක් සභාව පවත්වාගෙන යෑමට නොහැකියි. සභාව පවත්වාගෙන යෑමට දැනීමක් අවබෝධයක් තිබිය යුතුයි. ගරු සභාපතිතුමා රාජ්‍ය අමාත්‍යවරයකුට, කැබිනට් අමාත්‍යවරයකුටවත් කල නොහැකි වැඩ කොටසක් මේ මැදගම පත්තුවට සිදුකර තිබේ. සභාවේ සිටින පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඇතිවයි එතුමන් මේ කටයුතු සියල්ල සිදු කරන්නේ. ඒ සඳහා මන්ත්‍රීතුමන්ලා ගරු කලයුතු බව ප්‍රකාශ කරන ලදි. සභාපතිතුමන් සමඟ සහයෝගයෙන් වැඩකටයුතු කරනවිට අනෙක් අය සභාපතිතුමන්ට කඩේ යනවා යැයි පවසයි. සාධාරණණදේට මන්ත්‍රීතුමන් කඩේ යන බවත්, උදවු උපකාර කරන බවත්, ප්‍රකාශ කරන ලදි. විපක්ෂයේ කණ්ඩායම කිසි දවසක විරුද්ධ නොවුණි. මැදගම පත්තුවේ සිදුකරන යහපත් වැඩ සඳහා කිසිදු මන්ත්‍රීවරයකු විරුද්ධ නොවී සහයෝගයදුන් නිසයි මැදගම පත්තුව මේ තත්වයෙන් ගොඩනැගීමට හැකි වූයේ. මෙම ප්‍රදේශයේ කැබිනට් අමාත්‍යවරු හිටියා ඒ කිසිවෙකුටත් සතිපොළ සකස් කිරීම, බස්නැවතුම්පල සකස් කිරීමට නොහැකි වුණි. සභාපතිතුමන් නිරන්තරයෙන් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධවෙමින්, දේශපාලන අධිකාරිය සමඟ සම්බන්ධවෙමින් සියළු කටයුතු සිදුකර තිබේ. එසේ සිදුකලේ සභාපතිතුමන්ට ගෙදර ගෙන යෑමට නොව ප්‍රදේශයේ සිටින ජනතාවගේ ප්‍රයෝජනය සඳහායි. එම කටයුතු අවතක්සේරුවට ලක්කර මන්ත්‍රී ධූරය හෑල්ලුවට ලක්කිරීමක් සිදු නොකරන ලෙසට කාරුණික ඉල්ලීමක් කරන ලදි.

එසේම ඉදිරියේදී මැතිවරණයක් තියේද කියා නොදන්නා බවති, එසේ මැතිවරණයක් පැවතුනහොත් මන්ත්‍රීතුමන්ගේ කොට්ඨාශයෙන් මන්ත්‍රීතුමන් ජයග්‍රහණය කරන බව ප්‍රකාශ කරන ලදි. එතුමන්ගේ කොට්ඨාශයෙන් මැතිවරණය සඳහා කවුරුන් ඉදිරිපත් කලත් මන්ත්‍රීතුමන්ට අභියෝගයක් නොවන බව ප්‍රකාශ කරන ලදි. එතරම් යහපත් ආකාරයෙන් මන්ත්‍රීතුමන් ජනතාව සමඟ සිටින බව සඳහන් කරන ලදි. කොට්ඨාශයට ලැබුන මුදලින් හැම දෙයක්ම පොදුවේ සැමදෙනාටම සමසේ බෙදෙන ආකාරයට වැඩකටයුතු කල බවත්, කිසිම පුද්ගලයකු මෙපමණ කාලයක් දෝසාරෝපනය සිදුකර නොමැත. විපක්ෂය මන්ත්‍රීතුමන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන බවත්, එතුමන්ලාත් මන්ත්‍රීතුමන්ලාත් සභාව තුල සිටිය යුතුයි යන්ත තීරණය කල පිරිසක් සිටින බවත්, එසේම ගමේ පක්ෂ විපක්ෂ සියළුම ජනතාව තුල එම මතය පවතින බව ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදි. කවුරුන් මොනදේ පැවසුවත් මෙවර සභාව දිනන්නේද මන්ත්‍රීතුමන්ලාම වන බවද සඳහන් කරන ලදි. එසේම මේ වනතුරු මන්ත්‍රීතුමන්ලා සමඟ රැඳෙමින් සිට ජනතා විමුක්ති පෙරමුණට බැඳෙන හා මැතිවරණයට ඉදිරිපත්වන අයට කිසිදු කරදරයක්

වුවහොත් සොයා නොබලන බව ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමන්ගේ පියා වුනත් වරදක්නම් කරන්නේ එම අවස්තාවට සහභාගී නොවන බව ප්‍රකාශ කරන ලදි.එසේ සහභාගී වීමෙන් කිසිදු පලක් නොවන බව සදහන් කරන ලදි. මරණයක් සිදුවූ අවස්ථාවකවත් නොයන බව වැඩිදුරටත් සදහන් කරන ලදි. මන්ත්‍රීතුමන්ලා බර අදින්නත් අනික්අයට වාසි ලබා ගන්නත් එතුමන්ලා කැපවී නොමැති බවත්, මන්ත්‍රීතමන් අහිංසකයි කියා සිතන පිරිස් සිටියි. නමුත් ඒ අහිංසක මිනිසුන් තුල දරුණු මිනිසෙක් සිටින බවත්, එබැවින් ඒ අයගෙන් බේරී දේශපාලනය සිදුකරගෙන යන ලෙසට ඉල්ලීමක් කරමින් ගරු මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

<u>09.04.ගරු මන්ත්‍රී - ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමා</u>

ගරු මන්ත්‍රී ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමන් සභාවට අදහස් දක්වමින්, වසර ගණනාවක් සභාවේ කාලය ගත කලාට මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ සැබෑ තත්වය, සැබෑ මුහුණු දැං දැං එලිවෙමින් පවතින බව මුලින්ම සදහන් කරන ලදි. ඔවුන්ගේ මුහුණු අදුරු වීම සම්බන්ධයෙන් කනාගාටුවට පත්වන බවත්, එය සිදුකිරීමට දෙයක් නැත. මන්ද යතාර්ථය තේරුම් ගත් සමාජයක් විසින් ඔවුන් කොටසක් ප්‍රතික්ෂේප කරයි. එසේ ප්‍රතික්ෂේප කරන සමාජයක ඔවුන් නැවතත් බලයේ රැදී සිටීමට විවිධ උපාය උපක්‍රම යොදමින් සිටියි. මොන උපාය උපක්‍රම යෙදුවත් ඔවුන් මේ වන විට සමාජයේ නුගත් කියා සිතා ඔවුන් තලා පෙලා ඔවුන්ට කල හැකි සියළු පීඩනයන්ට ලක්කල  සමාජයේ අද වැරදි කල දේශපාලඥයා පැත්තකට තල්ලු කර නිවරදි දේශපාලනය රටට ආදාරය කරන වැඩපිලිවෙලක් තිබෙන දේශපාලනය අද තෝරාගෙන තිබේ. එයට කවුරු කවුරුත් විවිධාකාරයෙන් මඩ ගැහුවත්, විවිධ අවලාද නැගුවට මන්ත්‍රීතුමන්ලාට සැලෙන්නට දෙයක් නොමැති අතර, පුංචි සතුටක්ද පවතියි. මන්ද මඩ ගහන්නේ තමන්ට අවාසියක් සිදුවන විටයි. ගෙඩි ඇති ගහටයි පොළු ගහන්නේ කියා පැරණි කතාවක්ද තිබේ. එය දැං සිදුවෙමින් පවතියි. සභාවේ මන්ත්‍රීවරු කොටසකට මෙතරම් වේදනාවක් අත්වීම සම්බන්ධයෙන් දුකක් කනගාටුවක් මන්ත්‍රීතුමන්ට ඇතිවන බව පෙන්වාදෙන ලදි. එනමුත් සිදු කිරීමට දෙයක් නොපවතියි. මන්ද මේ සමාජ ක්‍රමය දේශපාලන ක්‍රමය නිසා ජනතාව සමාජයේ යතාර්ථය තේරුම් ගෙන සිටින නිසා හෙට දවසේ සමහර මන්ත්‍රීතුමන්ලාට ඒ තත්වය උදාවිය හැකියි. එයට මන්ත්‍රීතුමන්ට කරන්නට දෙයක් නොමැති බව සදහන් කරන ලදි.

මේ සභාවේ කතා කරන මන්ත්‍රීතුමන්ට සභාවේ ගරු සභාපතිතුමන් නිරන්තරයෙන් ඊලග සභාපති, ඉදිරියේ පත්වන සභාපති කියා ඔච්චම් කලත් ඒ ඔච්චම් කරන එකේත් යම් මානසික රෝගයක් වේ නම් එය මන්ත්‍රීතුමන්ලාම විසදා ගන්නා ලෙසට දැනුම් දෙන ලදි. මන්ත්‍රීතුමන්ලාට අවශ්‍ය වන්නේ සභාපති වීමටවත්, සභාව ලබා ගැනීමටවත් නොව මේ රට වෙනස් වී මේ භූමියේ සිටින ජනතාවට යහපත උදා කිරීමටයි. ඒ යහපත උදා කිරීමට එන ගමනේදී මෙතෙක් පැමිණි ගමනේ කුඩා කොටසක් හෝ බැලිය යුතුයි. පරාජය දරාගතනොහැකිව වියරු වැටී වෙන කවදාකටවත් වැඩිය සභාවේ මන්ත්‍රීවරු වියරු වැටී කැමොර දෙයි. නමුත් මන්ත්‍රීතුමන්ලා කිසි දිනක කැමොර නොදෙන බව පෙන්වා දෙන ලදි. ඉතිහාසය පුරාම මිනිස්සු තේරුම් නොගත් නිසා නිහඩව සිටි බවත්, මිනිසුන් තේරුම් ගන්නා තුරු නිහඩව සිටි බවත්,  මන්ත්‍රීතුමන්ලාට එවන්වූ ආත්ම ශක්තියක්, ඉවසීමක් තිබූ බව ඒවාගේම හොඳ නායකත්වයක් තිබූ බව පෙන්වා දෙන ලදි. නායකයෝ තමයි සභාවේ විවිධ ප්‍රකාශ කරන්නේ. 88/89 කියන්නට උත්සාහ ගනියි. ඒ පිළිබදව අදහස් ඉදිරිපත් කරයි. 88/89 නොව 87/88/89 නිවැරදි විය යුතුයි. එය කිසිවෙකුත් නොදනියි. ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කලේ 1987 වර්ෂයේයි. අත්පය කපා දැම්මේ ජනතා විමුක්ති පෙරමුණෙන් නොවේ. මේ රටේ එවකට තිබූ ප්‍රා කල්ලි, කහ බළල්ලු, කොළ බළල්ලු, මාපිලා, ගැරඩි යන බලකායවල් සකස් කලේ එතුමන්ලා නොවන බව සදහන් කරන ලදි. මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂයේ මිනිස්සු 60000 ක් මරනයට පත්කල බවත්,  මන්ත්‍රීතුමන්ලාට ඇගිල්ල දිගු කලාට නොදන්නා දේශපාලනය. මන්ත්‍රීතුමන්ලාට කාගේවත් බුදලයක් ලබා ගැනීමට අවශ්‍යතාවයක් නොමැති බවත්, අවහිරයන් සිදු කිරීමටවත් අවශ්‍යතාවයක් නොතිබුනි.

ඒවාගේම පසුගිය මැයි 09 වන දින වනතුරු මිනිස්සු නිහතමානී අරගලයක් සිදු කලා. මැයි 09 වන දින උදේ වරුව මිනිසුන්ට අමතකවී තිබේ. යකඩපොලු අරගෙන අට්ටාල කඩලා, කුඩු පට්ට වෙන්න පහර දී 07 දෙනකු මරපු අවස්ථා මතක නෑ. නමුත් එක් ඇමතිවරයෙක් මැරුනා කියා මතකය පවතියි. මන්ත්‍රීතුමන්ලා ඒවා අනුමත නොකරන බව ප්‍රකාශ කරන ලදි. 07 දෙනකු මැරුවා, ඔලු පැලෙන්න ගැහුවා ආබාධිතයින් විශාල ප්‍රමාණයක් අදටත් සිටියි. නිශාන්තලා කියන ඇමතිලා මන්ත්‍රීලා සැලකූ අයුරු මුළු ලෝකයම දුටු බව පෙන්වා දෙන ලදි. ඒවා මතක නෑ. මතකයේ තිබීමට මොළයක් නෑ මන්ත්‍රීතුමන් හිතන්නේ එසේයි. නමුත් මේ ක්‍රමය වෙනස් කල යුතුයි. වෙනස් කරනවා කියන කට්ටිය පහුගිය කාලයේ අවුරුදු 35 කට පෙර ඉතිහාසය මතක් කල හැකියි. නමුත් අවුරුදු 35 කට මෙහා කාලයේ කිසිම පුද්ගලයකුට දර පෙල්ලකින් පහරදී නැත, මිනිහෙකුට ටොක්කක් ඇන නැත, පහරදීලා නෑ, මරලා නෑ.නමුත් පසුගිය දින සිදුවූ පාස්කු ප්‍රහාරයෙන් මිනිස්සු මැරුවා මතක නෑ. අන්ධයින් බවට පත්වූ මිනිස්සු,අතපය කැඩුන මිනිස්සු මතක නෑ.මෙය සත්‍ය කතාව. මේවා මතක තබා ගත යුතුවේ.

එසේම රට තුල බෙහෙත් ටික නෑ.මිනිස්සුන්ට කන්න නෑ, මිනිසුන් බෙල්ලේ වැල දාගනියි. තවත් කොටසක් ගඟට පනියි.ඒ මන්ත්‍රීතුමන්ලාගේ ආණ්ඩුව කල දේවල් නොවේ. මන්ත්‍රීතුමන්ලාගේ කෙරුවාව නොවන මේ රටේ පාලකයින් කල හරියයි. ඒවා සාධාරණ බුද්ධියෙන් නොදැක අනුන්ට මඩ ගසන එක පුදුමයකි. එනිසා මේ ආකාරයට මඩ ගසමින්, බොරු කියමින්, අවලාද නගමින් තව දුරටත් මේ රටේ මහා විනාසයක් ඇති කල අය අනුන්ට ඇඟිල්ල දිගු කරයි. ඇඳුම් ඇද නැති මිනිසෙකු කවුරුන්ද ඇඳුම් ඇද නැත්තේ කියා විමසන්නාසේ පාලකයින් කටයුතු කරයි. එනිසා මේ දේවල් මන්ත්‍රීතුමන්ට නුහුරු දේවල් නොවේ. මේ දේවල් අසමින් තනියම එදාත් වැඩ කලා අදත් වැඩ කරගෙන යනවා හෙටත් වැඩ කරගෙන යන බව මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදි. වර්තමානය වන විට මන්ත්‍රීතුමන්ලා සමඟ මුළු මහත් සමාජයක් ඒකරාශීවී සිටියි. සමාජය පොහොට්ටුව හෝ වෙනත් දේශපාලන පක්ෂයකට ඡන්දය ලබාදී ඔවුන් අතින් අපරාධයක් සිදුවූනා කියා තේරුම් ගෙන තිබේ. එනිසා අපට අද සමාව ඕනි අප මේ සමාජය කෙසේ හෝ නිවැරදි කරනවා කියා මිනිසුන් අද වැඩ කටයුතු කරයි. එයට කිසිවෙකු වෛර කිරීමෙන් ප්‍රයෝජනයක් නොවේ. ජනතාව තේරුම් අරගෙනයි වැඩ කිරීමට පෙලඹී සිටින්නේ. මන්ත්‍රීතුමන්ලා ඔවුන් පොහොට්ටු කාරයා, යූන්පී කාරයා කියා, නැත්නම් වෙනත් දේශපාලන පක්ෂයක් කියා පැත්තක තියා නැත. රටවෙනුවෙන් තේරෙන මිනිසුන් පැමිණ වැඩ කරයි. මන්ත්‍රීතුමන්ලා පැමිණ ඇත්තේ ලාභ ලැබීමට කොන්ත්‍රාත් කිරීමට නොවන බවත්, එනිසා මන්ත්‍රීතුමන්ලා එතුමන්ලාගේ වැඩේ කරන බවත්, සභාපතිතුමන්ට පුළුවන්නම් ඉතිහාසයේත් කල ආකාරයට සල්ලි හොයා ගත්තා, සල්ලි අච්චු ගැහුවා, අච්චු ගහන්නට හේතු කාරණා පවසා තිබේ. ඩොලර් සොයා ගත් ආකාරය පවසා තිබේ. ඒ ආකාරයට සල්ලි අච්චු ගසා මැතිවරණය කල් දමා. ඒ සඳහා සභාපතිතුමන්ලා ආශිර්වාද කරනවා, එසේ ආශිර්වාද කර ආයෙත් වතාවක් සිල් රෙදි බෙදාදී,මිනිසුන්ට හාල් කිලෝ 10 ලබාදී, රෙදිත් බෙදා , මල් වට්ටිත් බෙදා .අනෙක් අතෙන් අරක්කුත් බෙදලා ,කුඩුත් බෙදා , ගංජාත් බෙදන්න ඕන දෙයක් බෙදන්න. එසේ බෙදාදී නැවතත් මිනිසුන් නොමග යවන්න. ඉන්පසු කැමති වෙලාවක මැතිවරණය තියන්න. හිතේ සතුට ඇතිවන අවස්ථාවක මැතිවරණය පවත්වා නැවතත් මිනිසුන් නොමග යවන්න. නමුත් රටේ ජනතාව අවශ්‍ය වෙලාවට තීන්දු තීරණ ගනියි. එනිසා මැතිවරන තියාල හෝ ආණ්ඩු බලය අරගෙන හෝ ඔබතුමන්ලා මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීතුමන් හැමදාමත් සහෝදරයින්ට සේ සලකන බවත්,අදත් එසේ අවලාද නැගුවට මොනවා කිව්වත් මොන චෝදනා කලත් මන්ත්‍රීතුමන්ගේ හදවතේ ඇත්තේ හැමෝම එකයි කියලයි. නමුත් ඔබතුමන්ලා එකයි කියලා හිතුවාට මන්ත්‍රීතුමන්ලා වෙනස් කියලා හිතුවාට පාලකයින් වෙනස්වේ. ඒ පාලකයින් අමාරුවී ඇත්තේ හිරේ විලංගුවේ යෑමයි. එනිසයි මැතිවරණ කල් දාන්නේ. එසේ නැත්නම් සභාපත්තුමන්ලා වෙනුවෙන් නොවේ. මෙහි සිටින සියළු දෙනා මන්ත්‍රීතුමන්ට විරුද්ද වූවාට සියළුම දෙනා එකම

පන්තියේ මිනිසුන්වේ. තියෙන පංතියේයි නැති පන්තියේ අතර වෙනස මන්ත්‍රීතුමන්ලා නොදන්නා බවත්, ඒ අය මේ අවස්ථාවේත් ඕල් දමන ආකාරය නොදනියි. මැතවරණ කල්දාමු කියයි. නැවත එලියට පැමිණ මැතිවරණ පැවැත්වීමට කතා කරයි. මේ සිටින අය ඒ පන්තියේද කියා සිතන්න බැරිද කියා සැකයක් පවත්න බවත්, මේ සිටින මිනිස්සු මන්ත්‍රීතුමන්ලාගේ පන්තිය නියෝජනය කරන බවත්, පන්තිය වෙනස් කරන්නේ මේ අයයි. පන්තිය වෙනස් කරන්නේ එක තැනකටයි වැඩ කරන්නේ වෙනත් තැනකටයි. මේ සභාවේ නායකයෝ මේ භූමියට නායකයෝ ඒ නායකත්වය කොපමණ ලබාදුන්නේද යන්න දැන් හොඳින් තේරෙන බව පවසන ලදි. එනිසා කවුරුත් බුද්ධියෙන් වැඩ කරමු කියා යෝජනා කරන ලදි.

ඒවාගේම අද ගරු සභාපතිතුමන් නීතිය නැමූ බව සඳහන් කරන ලදි. මෙතෙක් ඉතිහාසය පුරාම මේ භූමියේ, පොළ භූමියේ, නගර භූමියේ රැසවීම් පැවැත්වීමට අවසර ලබා දුන්නා. සභාපතිතුමන්ට මේ භූමිය ලියා දී නොමැත. සභාපතිතුමන් මේ භූමියට සභාපති, මේ භූමියේ වැඩ සන්නියාමය කරන කෙනා,මෙහෙයවන කෙනා,කළමනාකරණය කරන කෙනා පමණි. නමුත් කලමණාකරණය නිසි ලෙස සිදුකර නොමැත. මීට පෙරත් සභාපතිතුමා ගිය පළාත් සභාවේ මන්ත්‍රීතුමන් රැස්වීමක් පැවැත්වීමට බස්නැවතුම්පල භූමිට ඉල්ලූවිට ලබා නොදී සභාපතිතුමා ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා ගෙන්වා එම ස්තානයේම රැස්වීම පැවැත්වූ බව සඳහන් කරන ලදි.එනිසා සභාපතිතුමන්ගේ අද මේ සිදු කල වෙනස් කිරීම මන්ත්‍රීතුමන් සතපනහකට ගණන් නොගන්නා බව පවසන ලදි. මෙය බොරුවකි.වංචාවකි.දේශපාලන කුහක කමකි.ගරු සභාපතිතුමන් දේශපාලනට මාරම කුහකයෙකි. එනිසා මෙය හරි හිරිකිතයි, හරි කැතයි. මේවගේ තීන්දු තීරණ ගෙන අනුන්ට දේශපාලනිකව හිරිහැර කරන්න එපා. සභාපතිතුමන් පොදු කෙනෙක් නම් කාටත් එකඟ විය යුතුයි. සභාවේ මන්ත්‍රීවරයකු මේ මොහොතේ පැවසුවා එතුමන්ට ඡන්දය ලබා දෙන්නේ නැති කිසිම ජනතා විමුක්ති පෙරමුණේ අයකුගේ මල ගෙදරකටවත් පය ගහන්නේ නැති බව, පස්පාගන්නේ නැති බව ප්‍රකාශ කලා.නමුත් මන්ත්‍රීතුමන්ලා එසේ නොකරන බව ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමන්ලාට ඡන්දය දුන්නත් නොදුන්නත් ඔවුන් සියලු දෙනා මිනිසුන් වේ. මිනිසුන්ට මිනිස්කමට මන්ත්‍රීතුමන්ලා සලකන බව පෙන්වා දෙන ලදි. එයයි මන්ත්‍රීතුමන්ලාගේ අවබෝධය වෙන අවබෝධයක් නොපෙනේ. එනිසා ගරු සභාපතිතුමා ඔවැනි නීති රීති ගෙනල්ලා මන්ත්‍රීතුමන්ලා යන ගමන නැවැත්වීමට නොහැකි වන බවත්, රටේ මිනිසුන්ගේ සාධාරණ ඉල්ලීමක් පවතියි. ඒ ඉල්ලීමට ඇහුම්කම් දුන්නොත් විතරයි තේරුම් ගැනීමට හැකි වන්නේ . එනිසා සභාපතිතුමන්ලා කැමති තීරණයක් ගන්න මන්ත්‍රීතුමන්ලාට කල හැකි දෙයක් කරන බවත්, මන්ත්‍රීතුමන්ලා පමණක් නොව මේ සමස්ථ සමාජයම යහපත් තීන්දුවක් ගනියි. එදාට සියළු දෙනාට උත්තර නැතිවෙයි යනුවෙන් පවසමින් ගරු මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**ගරු මන්ත්‍රී උදය බන්දුල මැතිතුමන් අදහස් ඉදිරිපත් කර ඒ සඳහා පිළිතුරු ලබාදීමට ප්‍රථමයෙන් සභාවෙන් බැහැරව යන ලදි.**

**09.05.ගරු උප සභාපති - ආර්.එම්.කේ.බිමල් රත්නායක මැතිතුමා**

ගරු උප සභාපති ආර්.එම්.කේ.බිමල් රත්නායක මැතිතුමන් සභාවට අදහස් දක්වමින්,අද දිනයේ පවත්වන්නේ අවසන් මහ සභා රැස්වීම බව මන්ත්‍රීතුමන්ලාගේ අදහස් වලින් ප්‍රකාශ විය. එය කෙසේ වෙතත් කරුණු කිහිපයක් සභාවේ කතා කල යුතු බව මුලින්ම සඳහන් කරන ලදි. මන්ද මෙම ස්ථානයේ උදය බන්දුල මැතිතුමන් සභාව තුල රැඳී නොසිටියත් පැවසිය යුතුයි ගරු මන්ත්‍රී ජයසුන්දර මැතිතුමන්හට ජනතා විමුක්ති පෙරමුණෙන් සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වූ බව සඳහන් කරන ලදි. සත්‍ය වශයෙන්ම මෙම ස්ථානයේ බන්දුල මන්ත්‍රීතුමන් සිටියේ නම් හොඳවේ. ඔහු නොදන්නා දේවල්ද උප සභාපතිතුමන්ට කියා දීමට හැකියාව තිබුණ බව සඳහන් කරන ලදි.

මැදගම නගරයේ සිට මීටර 250 ක පමණ දුරින් උප සභාපතිතුමන්ලා පාසල් යන කාලයේ එතුමන්ලාට පහල පන්තියේ සිටි අබේකෝන් මන්ත්‍රීතුමාගේ මස්සිනා දක්ෂ දරුවෙක් හැමදාමත් පන්තියේ පළමුවෙනි තැන ගනියි. උදය බන්දුල මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ආකාරයට ප්‍රා අර කල්ලි මේ කල්ලි වලින් මිනිසුන් මැරුවා කියනවා නම් මෙම ස්ථානයේ සිටියේ නම් ඔහුගෙන් විමසීම් කරනවා අදටත් ඒ පුද්ගලයා සිටින්නේ මුණින් අතටයි. එම දරුවා අනතුරට ලක්වන අවස්ථාවේ පාන්දර 3.30 ට පමණ එම ස්ථානයට උප සභාපතිතුමන් ගිය කෙනෙකු බව පවසන ලදි. එම දරුවා උත්සලා ගත්තෙත් උප සභාපතිතුමන් බව ප්‍රකාශ කරන ලදි. එදා ඒ දරුවාට පිහි පහරවල් පනස් ගානක් සම්පූර්ණ කොඳුනාරටියටත් ඇගටත්ඇන තිබුනි. 1989 වර්ෂයේදී මෙම අනතුර සිදුවිය. එදා සිට අදවනතුරු උප සභාපතිතුමන් එක් දවසක් පමණක් එම පුද්ගලයා බැලීමට ගිය බව ප්‍රකාශ කරන ලදි. ඒ එක දවසත් ගියේ දේශපාලන ප්‍රචාරක කටයුත්තකට යන අවස්ථාවේ ඔහු නිවසේ නැතැයි සිතාගෙන ගියද ඔහු සිටියා අදටත් එම පුද්ගලයා මුණින් අතට සිටියි. නිමල් මන්ත්‍රීතුමන්ලාත් දැකලා ඇති තාමත් ඔහු සිටින්නේ මුණින් අතටයි. ඒ දරුවා හොඳින් ජීවත් වෙලා සිටියේ නම් අද ඔහු මේ රටේ මහාචාර්යවරයෙකි. එතරම් බුද්ධිමත් උගත්කමක් තිබූ දරුවෙකි. එතකොට ඒ පවුලේ තවත් කණ්ඩායමක්ද මිය ගිය බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම උප සභාපතිතුමන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය කරන කාලයේ දන්නාව LTTE සංවිදානය විසින් ඩොලර් ෆාම්, කෙන් ෆාම් මුලින්ම සිවිල් වැසියන් කපා කොට මරා දමා තිබෙනු දුටුවේ. මෙම ප්‍රදේශවල මිනිසුන් මරා තිබූ බොහෝ ස්ථානවලට උප සභාපතිතුමන් ගිය බවත්, එම ස්ථානවලදී උප සභාපතිතුමන්ට මතක් වූයේ ඒ ඩොලර් ෆාම්,කෙන් ෆාම් වල ධීවර ජනතාව LTTE සංවිධානයෙන් කපා තිබූ ආකාරයයි. ඒ ආකාරයටයි මේ ජේ.වී.පී. ත්‍රස්තවාදීන් අප ප්‍රදේශවල මිනිසුන්ගේ ඝාතන සිදුකර තිබූයේ. කටින් පටන්ගෙන ඔළුව පිටිපසට යනකල් ඉරා බෙලි කපා දමයි. ඉතාමත් සෝචනීය මරණයක් සිදුවූයේ කණුල්වෙළ රහමතුල්ල මුදලාලිටයි. සත්‍ය වශයෙන්ම එම මරණය කිසිවෙකුටත් දැකිය නොහැකියි ඒ ඝාතනය සිදු කර තිබූ ආකාරය. බන්දුල මන්ත්‍රීතුමන්ලා කතා කලාට රටේ සිදුවූ ගිනි තැබීම් ජයසුන්දර මන්ත්‍රීතුමන්ට ටිකක් අමතක වූවාට ආරම්භ වූයේ 1987 දීයි. ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමත් සමඟයි. රටේ තිබූ බස්රථ සියල්ල ගිනි තබමින්, ට්‍රාන්පෝමර් ගිනිතබමින් අරගලය කොළඹින් ආරම්භ කරන ලදි. මැදගම පත්තුවේ සිටි ග්‍රාම නිලධාරීන් තිදෙනෙකු හැර අනෙක් සියළුම දෙනා මරා දමන ලදි. ඒ හිතවත් කම නිසා අත්හැර දමා තිබුණි. විදුහල්පතිවරු, ගුරුවරු මරා දමන ලදි. මංකොල්ල කෑවේ නෑ කියා ඔවුන් පවසයි. නමුත් රෝහණ විජේවීර ඝාතනය වූ පසු බොරලැස්ගමුවේදී ජනතා විමුක්ති පෙරමුණේ සහයකයකු හමුවුණා ඔහු ලග රත්තරං කිලෝ 200 කට වැඩි ප්‍රමාණයක් පැවතුණි. ඒ අහිංසක මිනිසුන්ගේ දේවල්ය. උප සභාපතිතුමන්ලාට ඒ කාලයේ පැමිණ පවසයි වයසක අම්මලා දැන මාල වළළු ඔවුන්ට වැඩක් නැති බව පවසමින් ගලවාගෙන ගිය අවස්ථා. ඒවා එකතු කරගෙන අරමුදලක් සකස් කරගෙන තිබේ. බන්දුල මන්ත්‍රීතුමන් හොරකම් නොකල බව පැවසුවාප්‍රාරා කල්ලි ,කළු බළල්ලු , මහා බළල්ළු යන සංවිධාන ආරම්භ වූයේ ජනතා විමුක්ති පෙරමුණෙන් සිදුවන අපහසුතා ඉවසාගත නොහැකිව තරුණයින් විසින් නිර්මාණය කරගත් නිසාය. හමුදාවේ පොලීසියේ ගිණුමට දැම්මට සිදුකලේ තරුණ කණ්ඩායම් විසිනි. ඔවුන් නොපැමිණියේ නම් මේ ආකරයට මැඩපැවැත්වීමට නොහැකි වේ.

නිවෙස්වල තිබූ දරුවන්ගේ ආ ඉත්තම් පදක්කම් ආදිය නිවෙස් වලතබා ගිය විට ඒ ටික දෙමාපියන් බියවී වැසිකිළි වලවල් වලට දමා තිබේ. අදටත් එම දරුවන්ට එම කුසලාන හා සම්මාම අහිමිවී තිබේ. අදටත් ඒ සහතිකපත් අහිමි පුද්ගලයින් හමුදා සේවයේ සිටියි. එවන්වූ අපරාධ කර අද පවසනවා විවිධ දේවල්. බන්දුල මන්ත්‍රීතුමන් ඒ කාලයේ අවුරුදු 10 ක 15 ක දරුවෙක් විය හැකියි. එනිසා ඒ සිදුවීම් පිලිබඳව නොදනියි. පුවත්පත්,සමාජ මාධ්‍ය,විද්‍යුත් මාධ්‍ය හැම එකකින් පෙන්වනවිට ඔවුන්ට නෑ කියන්නට බෑ. කොයිතරම් නම් හම්බකරගෙන තිබේද. කටුමැටි ගෙවල්වල සිටි අය තට්ටු 02/03 නිවාස ඉදිකර තිබේ.රබර් කිරි කපා එසේ ගෙවල් හැදීමට

නොහැකියි. දිනවකවානුත් සමග නම් ගම් ඇතුළුව සිදුවීම් පැවසීමට තිබුනා බන්දුල මන්ත්‍රීතුමන් සිටියේ නම්. එසේ නම් ඔහුට පිලිගැනීමට සිදුවේ. පක්ෂ විපක්ෂ වුවත් සමාජයේ මහජන නියෝජිතයින් හැටියට මේ කරන වංචාවල් බොරු මවා පෑම් සමාජයට, ජනතාවට දැන ගැනීමට හෙලිදරව් කල යුතුයි. නැත්නම් අද සමාජයේ සිටින තරුණ ළමුන් මේවා නොදනියි. මැදගම පත්තුවේ එක ගමක් තියෙනවා ප්‍රධාන සංවිධායක ධර්මදාස බංඩා ඇමතිතුමන්ගේ මවගේ ගම්මානය ඉලුකුඹුර රම්මිණිගම ගම්මානය ජනතා විමුක්ති පෙරමුනේ අයගෙන් ඒ කාලයේ වැඩි බලපෑමක් තිබුයේ ඒ ගම්මානයටයි. මන්ද ධර්මදාස ඇමතිතුමන්ගේ පවුලේ අය එම ප්‍රදේශයේ සිටි නිසායි. ඒ කාලයේ අවුරුද්දක් දෙකක් වන කුඩා දරුවන් අද තරුණයින් බවට පත්ව සිටියි. ඒ අය මේ ගැන නොදනියි. ඒ කාලයේ සිටි වැඩිහිටියෝ බොහෝමයක් ජීවත් නොසිටියි. මේ පිලිබඳව උප සභාපතිතුමන්ලාටවත් කියා දිය නොහැකියි. මන්ද එතුමන්ලා පක්ෂය පිලිබඳ වෛරයෙන් ඒ දේවල් පවසන බව සිතිය හැකි නිසා. රජයේ දේපළ විනාශ කර මේ තත්වය රට පත්කර දැන් රට හදන්නට යනවා යැයි කියායි කටයුතු කරයි.

මැදගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ උප සභාපතිතුමන් එම ස්ථානයේ සිටින කල් ආවේ නෑ. එතුමන් එම ස්ථානයෙන් ගියාට පසු දිනයේම මැදගම ප්‍රදේශීය ලේකම් කාර්යාලය ගිනි තැබූ බව ප්‍රකාශ කරන ලදි. නමුත් පසුදින වැටුප් ගෙවීමට තිබූ මුදල් ඇමූ පෙට්ටිය සොයා ගැනීමට නොහැකි විය. උදේ බලද්දී මුදල් ඉතිරිවී තිබුණි. ඔවුන් හොදින්ම සැලසුම් කර මෙම ගිනි තැබීම සිදුකර තිබුණි. සමහර ඉඩම්වලට අදාළ ඔප්පු නෑ කියන්නේ ඒ කාලයේ ගිනිගත් ඒවා විය හැකියි.

මීට වසර 05 කට පෙර පෙබරවාරි මාසයේ දිනයක ඡන්දය පැවතුණි. දැනට වසර 05 ක් ගතවී තිබේ. කවුරුන් මොන දේ කිව්වත් එදා 2018 අප්‍රේල් මස 04 වනදා උප සභාපතිතුමන් ගතයුතු තීන්දුවක් ගෙන යහපතක් වෙයි සිතා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමන් සමග එක්වී සභාපතිතුමන්ට සහය ලබාදී සභාව පිහිටවූ බව ප්‍රකාශ කරන ලදි. උප සභාපතිතුමන් මානසිකව හොදින් තෘප්තිමත්වන පුද්ගලයෙකි. මන්ද මේ වසර 05 ඇතුලතදී සභාපතිතුමන්ගේ ආශිර්වාදයෙන් විහාල වැඩ කොටසක් සිදු කර ගැනීමට හැකිවූ බව ප්‍රකාශ කරන ලදි. ඉහල දේශපාලන අධිකාරියෙන් හෝ රජයේ ආයතනවලින් යම් කටයුත්තක් සිදු කර ගන්නා විට ලිපි ඉදිරිපත් කරන්නේ නම් ඒ පිළිබඳව ගරු සභාපතිතුමන්ගෙන්ද කරුණු විමසා ලිපියද එතුමන්ට පෙන්වා අදාළ ආයතනවලට ඉදිරිපත් කරනවා. සමහර අවස්ථාවල ගරු සභාපතිතුමන් ලිපිවල අකුරක්වත් වෙනස් නොකර ඉදිරිපත් කිරීමට ලබා දෙයි. ඒ ආකාරයට උසස් නිලධාරීන් සමග කටයුතු කර ප්‍රදේශයට යමක් කරගෙන තිබේ. ඉදිරි කාලයේදී ඒවා දැනුම් දෙන බවත්, දිනවකවානු සහිතව හුවමාරුවූ ලිපි පවා අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කරන බව සදහන් කරන ලදි. මහජන නියෝජිතයෙක් ලෙස, ආණ්ඩු පක්ෂයේ නගරයේ මන්ත්‍රීවරයා ලෙස සභාපතිතුමන් නගරය දියුණු කිරීමට සිදුකල හැමදේකටම අනෙක් සහෝදර මන්ත්‍රීවරුන් සමග අනෙක් විපක්ෂයේ මන්ත්‍රීවරුන් සමග විශාල වැඩ කොටසක් සිදුකල බව ප්‍රකාශ කරන ලදි. ජනතා විමුක්ති පෙරමුණෙන් මොනාද කරලා තියෙන්නේ කියා කෑ ගැහුවාට නගරයේ පෙනෙන්නට තිබෙන කෝටි ගණනක මිලියන ගණනක දේවල් කර තිබෙන්නේ කවුද කියා තේරුම් ගත යුතුයි. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඒ සදහා ලබා දය හැකි උපරිම සහයෝගය ලබාදුන්නා. බන්දුල මන්ත්‍රීතුමන් සභාවට පැමිණ මොනදේටත් විරුද්ධවී බෙදීමක් ඉල්ලා සිටියි.උප සභාපතිතුමන්වත්, මෙහි සිටින අනෙක් මන්ත්‍රීතුමන්ලාවත් සභාවේ කරන කතා වලින් ලගම සිටින නායකයා තෘප්තිමත් කිරීමට කටයුතු නොකරයි. කිසිවෙකු සභාවේ මෙවන් අදහසක් ඉදිරිපත් කලා කියා පක්ෂයේ ඇමතිවරුන්ටවත් වෙනත් අයකුටවත් නොපවසයි. නමුත් බන්දුල මන්ත්‍රීතුමන් ඊලග සිටින පක්ෂයේ නායකයා හෝ සංවිධායකවරයා, පක්ෂය තෘප්තිමත් කිරීමට මේ සියළු දේ සිදු කරයි. අනික් කාරණාව කපටිකම අතින් බන්දුල මන්ත්‍රීතුමන් අංක 01 ට සිටියි. සභාවේ සිට උප සභාපතිතුමන්ලා සමග කතා කර සියළු තොරතුරු දැනගනියි. පසුගිය කාලයේ කොටබෝව කඩ බදු දීමේදී සිදුවූ ගැටළුව සම්බන්දයෙන් හිටපු සභා ලේකම්තුමන්ගෙන් අසා සියළු තොරතුරු දැනගෙන අදහස් ප්‍රකාශ

කිරීමේදී මෙම සිදුවීම කුමක්ද? මෙහි තේරුම කුමක්ද? කියා පවසමින් අනෙක් අයට ඒ සම්බන්ධයෙන් කරුණු කියා දීමට එයි. එනිසා මේ සභාවේ උප සභාපතිවරයා,ගමේ මන්ත්‍රීවරයා හැටියට එතුමන් තෘප්තිමත් වන බව ප්‍රකාශ කරන ලදි. කවුරුන් මොනදේ කිව්වත් සභාපතිතුමන් මන්ත්‍රීතුමන්ලා සමග එක්ව ප්‍රදේශයට යමක් කල බව ප්‍රකාශ කරමින් සියළුම දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් ගරු උප සභාපතිතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>09.06.ගරු මන්ත්‍රී - ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා</u>**

ගරු මන්ත්‍රී ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමන් සභාවට අදහස් දක්වමින්, සබාවට අදහස් ඉදිරිපත් නොකිරීමට අදහස් කර සිටියත් උදය බන්දුල මන්ත්‍රීතුමන් අදහස් දක්වා මෙම ස්ථානයෙන් බැහැරව ගියා. එතුමන්ගේ කතාව සියළු මන්ත්‍රීවරු අසාගෙන සිටියත් අනෙක් මන්ත්‍රීවරු අදහස් දැක්වීමට පෙර මෙම ස්ථානයෙන් බැහැරව යෑම එතරම් සුදුසු නොවන බව සඳහන් කරන ලදි. එතුමන්ගේ කතාවට ලබාදෙන පිළිතුරද පටිගත කරගෙන ගියේනම් යහපත් වන බව ප්‍රකාශ කරන ලදි.

මන්ත්‍රීතුමන් පක්ෂයකට මඩ ගසනවා නොව ජනතා විමුක්ති පෙරමුණ පිළිබදව මන්ත්‍රීතුමන්ගේ දෑසින්ම දුටු දේවල් පවතින බව සඳහන් කරන ලදි.1987/1988/1989 කාලයේ භීෂණ සමයේ මන්ත්‍රීතුමන්ගේ කොට්ඨාශයේ වැඩිම පිරිසක් මියගොස්තිබේ. කුඹුක්කන් ඔයේදී 18 දෙනකුගේ බෙලි කපා බෙල්ල එක පැත්තක කද එක පැත්තක තියා තමයි ඒ මිනිසුන් ප්‍රචන්ඩත්වය පැතිරවූයේ. පොල්ගහපිටිය පැත්තේ එක් නිවසක් තාත්තා සහ පුදා එකවරම මරා දමා තිබේ. එසේම ප්‍රදේශයට සිටි හොද විදුහල්පතිවරයකු වන කිරි බංඩා මහතාගේ බෙල්ල කපා දමන ලදි. තවද හිටපු ග්‍රාම නිලධාරී ජයේ මහතාගේ බෙල්ල කපා දමයි. එසේම කෝන්ගහ ලන්දේ සුදු බංඩා මහතාගේ බෙල්ල කපා දමූ බවත්,ඒ ආකාරයට පවුල් 18 කගේ පිරිසකගේ බෙල්ල කපා දමා ගොස් තිබුනි. මන්ත්‍රීතුමන්ට ඒ දිනය හොඳින් මතක තිබෙන් බව ප්‍රකාශ කරන ලදි.ඒවන විට මන්ත්‍රීතුමන්ගේ වයස අවුරුදු 04 ක් 05 පමණ වේ. මන්ත්‍රීතුමන්ගේ ආච්චිලාගේ නිවසේ මන්ත්‍රීතුමන්ගේ අම්මාගේ තාත්තා මන්ත්‍රීතුමන්ගේ සීයා ඉස්සර ඉදලම කඩයක් කරගෙන ගිය බවත්, විපක්ෂනායකතුමන් හොඳින් දන්නවා ඇති. ඒ කාලයේ ධනපාල මුදලාලී කියූවිට නොදන්නා කෙනෙකු නැති තරම්.එම කඩේටම ඇවිත් සීයාගේ කටට තුවක්කුව තබා ඇදගෙන ගොස් බලපත්‍ර සහිත තුවක්කව රැගෙන ගිය බව ප්‍රකාශ කරන ලදි. එසේම ගමේ අක්කා කෙනෙකු ජනතා විමුක්ති පෙරමුණෙන් මිනිස්සු මරණ බව පවසමින් කෑ ගසාගෙන එනවිට මන්ත්‍රීතුමන්ගේ යාළුවෙක්ට ජනතා විමුක්ති පෙරමුනේ අයකු කනට ගැසූවිට ඔහුගේ අතේ ඇගිලි 05 ම යාළුවාගේ මුහුණේ වැදී තිබුනා. එවන් භීෂණයක් ඇස් දෙකින් දැකපු වේදනාව මන්ත්‍රීතුමන්ලාගේ සිත්තුල තවමත් පවතින බව ප්‍රකාශ කරන ලදි. මොන විදිහට මැතිවරණ ව්‍යාපාර කරගෙන ගියත් සමහර නිවෙස්වල ජනතා විමුක්ති පෙරමුණෙන් යනතුරු කැති පොරෝ තබාගෙන සිටියි. එවන් වැඩ පිළිවෙලක් කරගෙන ගිය පක්ෂයකි ජනතා විමුක්ති පෙරමුණ.

පසුගිය මාස 06 කට 07 කට පෙර මෙරටේ ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු ලෙස ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එලවීමට අරගල කරනවිට එය නිර්පාක්ෂික අරගලයක් වශයෙන් තෙල් ටික නැති වෙලාවේ, පොහොර ටික නැති වෙලාවේ,ගෑස්ටික නැති වෙලාවේ මිනිසුන් නිර්පාක්ෂික අරගලයටකට යොමු වුනා.අන්තිමට එම ස්ථානයට ජනතා විමුක්ති පෙරමුණ මැදිහත්වී දහස් ගණනින් නිවාස ගිණි තබා උදේණි අතුකෝරල වැනි පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් සභාවේ ඉද එක්වරම පාර්ලිමේන්තුවට පැමිණි යහපත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තට්ටු දෙක තුනකින් පහලට ඇදගෙනවිත් බල්ලන් කුකුළන්සේ ඝාතනය කල බවත්, එදා ඒ ගෙවල් හත්සිය ගණනක් රටේ ගෙවල් ගිනි තියද්දී මේ මැදගම නගරයේත් ප්‍රචන්ඩත්වය පැතිරුණ බව ප්‍රකාශ කරන ලදි.එදින මන්ත්‍රීතුමන් නගරයේ සිටි අතර, ඒ ප්‍රචන්ඩත්වය මන්ත්‍රීතුමන් සියසින් දුටු බව සඳහන් කරන ලදි. විවිධ කණ්ඩායම්, මන්ත්‍රීතුමන්ගේ කොට්ඨාශයෙන් මැතිවරණයට ඉදිරිපත්වී සිටින අපේක්ෂකයා පවා කඩවල්වල ගොස් කඩවල් වලින් රතිඤ්ඤා අරගෙන,මුදල් ලබාගෙන,

අරක්කු ලබාගත් බවත්, ගරු සභාපතිතුමන්ගේ නිවසට ගිණි තැබීමටද යම් වැඩ පිළිවෙලක් නගරය තුල ක්‍රියාත්මකවූ බවත්, මන්ත්‍රීතුමන්ලාට පවා පහර දීමට ඒ මිනිසුන් සැලසුම් කර තිබුණා. එවන් භීෂණයක් පසුගිය කාලය තුල මැදගම නගරයේ පැවතුන බව ප්‍රකාශ කරන ලදි. එසේ භීෂණයක් තිබූ නිසයි ව්‍යාපාරිකයින් මන්ත්‍රීතුමන්ලාට පවසන්නේ මිනිසුන් යම් ප්‍රමාණයකින් හැඩගැසී සිටිනවා. නමුත් ආර්ථිකය අමාරුයි.ප්‍රශ්න තියෙනවා, මිනිසුන්ට සල්ලිනෑ, එසේ වුවත් දැන් නගරයට මිනිස්සු ප්‍රමාණයක් පැමිණේ.ඒ මිනිස්සු එන නිසා ව්‍යාපාර කරගෙන යැමට හැකියි. මැතිවරණය නිසා මිනිස්සු නැවත බීමක්ව හැසිරී තවත් ගැටුම් ඇති කරයි.එනිසා මිනිස්සු නගරයට එක්රැස්වීම වැලැක්වීමට ක්‍රමවේදයක් සකස් කරන්න කියා ඔවුන් ඉල්ලයි. එනිසායි ගරු මන්ත්‍රිතුමන් පෞද්ගලිකව පක්ෂවල තියෙන තරහකට නොවේ මන්ත්‍රීතුමන් යෝජනා කලේ සභාව සතු ක්‍රීඩා පිටිය තිබෙනවා එයින් සභාවටද ආදායමක් ලැබෙනවා. එසේම රැස්වීම් පැවැත්වීම සඳහා විශාල සම්මන්ත්‍රණ ශාලාවක් සකස් කර තිබේ. එහි රැස්වීම් පවත්වන විට සභාවට ආදායමක් ලැබේ. එනිසයි මන්ත්‍රීතුමන් යොජනාවක් කලේ මැතිවරණයකට ඉදිරිපත්වන ඕනෑම පක්ෂයකට ක්‍රීඩා පිටිය හෝ සම්න්ත්‍රණ ශාලාව ලබා දෙන්න කියා.එය බන්දුල මන්ත්‍රීතුමන් සමග ඇති පෞද්ගලික තරහක්වත්, ජනතා විමුක්ති පෙරමුණ සමග ඇති පෞද්ගලික තරහක්වත් නොවේ.එනිසා සභාපතිතුමන් විසින් ගෙන ආ යෝජනාව පිළිබදව සතුටු වන බව ප්‍රකාශ කරන ලදි. මන්ද මන්ත්‍රීතුමන්ලාට අවශ්‍ය වන්නේ දැනට මාස 06 කට පමණ පෙර තිබූ භීෂණය නැතිවී මිනිසුන්ට සාමකාමීව ඔවුන්ගේ දෛනික ජීවිතය පවත්වාගෙන යැමට මහජන නියෝජිතයින් ලෙස මන්ත්‍රීතුමන්ලා බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම ජනතා විමුක්ති පෙරමුණ සෑම වේදිකාවකම පවසන්නේ හොරු ඉන්නවා, හොරු අල්ලනවා යනුවෙනි. මීට දින 03 කට පෙර කොළඹ මහනගර සභාවේ ටයිල් කැට 400 ක් හොරකම් කර හසුවුණා ජනතා විමුක්ති පෙරමුණේ නාගරික මන්ත්‍රීවරයකු. ඊට කලින් දවසක 88/89 භීෂණය මතක් කලා කියා අවුරුදු 04 ක පමන කුඩා දරුවෙකුට මැතිවරණ අපේක්ෂකයකු පහරදෙයි. එවන් මිනිසුන් අද ඇලඩින්ගේ පුදුම පහන ගේනවාසේ නිර්මාණය කරන්න සූදානම් වේ. මිනිස්සු ලගට ගොස් බොරු පවසමින් ගිය වතාවේ පොහොට්ටුවට වැඩ කල මිනිස්සු අදවන විට එකතුවී සිටියි.ඔවුන් සිතා සිටින්නේ මන්ත්‍රීතුමන්ලා පෞද්ගලිකව වැරදි කරා කියායි. මන්ත්‍රීතුමන්ගේ කොට්ඨාශයට ලැයිස්තුවෙන් ඉදිරිපත් කර සිටින අපේක්ෂකයා බීමත්ව පොලීසියට හසුවේ. මේවා මඩ ගැසීමට පවසනවා නොවේ. එතුමා පසුගිය කාලයේ පොහොට්ටුවේ ගුරු සංගමයේ සිටි නිලධාරියකි. එතුමන් මන්ත්‍රීතුමන්ට විරුද්දව ඡන්දය ඉල්ලන්නේ ඒ අවස්ථාවේ මන්ත්‍රීතුමන් ඔහු බේරා නොගත් නිසා බව පවසන ලදි.රටේ නීතියක් පවතියි. ඒ නීතිය ක්‍රියාත්මක වේ. මන්ත්‍රීතුමන්ට ඔහු බේරා ගැනීමට නොහැකි වූ බවත්, නගරයේ වුවත් ආණ්ඩු පක්ෂයට විරුද්ධව යන්නේ සභාපතිතුමන් ඉවත් කිරීමට කියූ අනවසර ඉදිකිරිමක සිටින අය කටයුතු කරනවා විය හැකි බවත්, එය රටට ආදරයට පක්ෂයට ආදරයට කරන දෙයක් නොවේ. මෙහි සිටින මන්ත්‍රීවරු නැවත පත්වී පැමිණි විට නගරය ආරක්ෂා කර ගැනීමට ඔවුන්ට වගකීමක් පවතියි. ඒ සඳහා සභාවට පැමිණෙයි. මන්ත්‍රීතුමන්ලාගේ පෞද්ගලික කාරණා නිසා නොව මිනිසුන්ගේ පෞද්ගලික කාරණා නිසා මන්ත්‍රීතුමන්ලා විවේචනය කරන්නේ.

මන්ත්‍රීතුමන් අදත් කියනවා හෙටත් කියනවා ගරු සභාපතිතමා හොද නායකයකු බව, සභාපතිතුමන් හොදින් වැඩ කටයුතු කරයි. ඒ හැකියාව මන්ත්‍රීතුමන්ට නොමැති බවත්, පුරුද්දක් ලෙස මන්ත්‍රීතුමන් ප්‍රමාද වනතුරු නිදා ගන්නා බවත්, අද සභාවටත් ප්‍රමාදවී පැමිනි බවත්, සභාපතිතුමා කරන වැඩකටයුතු ප්‍රමාණය මන්ත්‍රීතුමන්ට කල නොහැකි බව ප්‍රකාශ කරන ලදි.ගරු සභාපතිතුමන් උදෑසනින් අවදිවී විශාල සේවාවක් මේ ප්‍රදේශයට සිදුකර තිබේ.ඒ සේවාව මිනිසුන් අගය කරයි. වසම් 35 ම ජනතාව ඒ සේවාව හොදින් දැක තිබේ.නගර යහපත් අයුරින් නිර්මානය කර තිබේ. රාත්‍රී 10/11 පමණ වනතුරු මිනිසුන්ට සේවය කර තිබේ. මැදගම කොට්ඨාශයේ මළගෙවල් 200 කට පමණ පෞද්ගලිකව පෙට්ටි අරන්දී තිබේ.රැයක් දවාලක් නැතිව වැඩ කරයි.

එය මිනිසුන් තීරණය කරයි. ඡන්දයක් පැවතුනහොත් එය බලා ගැනීමට හැකියි. එසේම ගරු සභාපතිතුමන් නැවත වාරයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස පත්විය යුතුයි යන්න මන්ත්‍රීතුමන්ගේ පෞද්ගලික මතය වන බවත්, සඳහන් කරන ලදි. ඉදිරි මැතිවරණයට මන්ත්‍රීතුමා සහ නිමල් මන්ත්‍රීතුමා එකම කොට්ඨාශයෙන් ඉදිරිපත්වන වන බවත්, එම මැතිවරනයෙන් කවුරුන් ජයග්‍රහණය කර පැමිණියත් මන්ත්‍රීතුමන් සභාවට පැමිණෙන්නේ ගරු සභාපතිතුමන්ට සහය දැක්වීමට බවත්,ප්‍රකාශ කරන ලදි. ඒවාගේම ගරු සභාපතිතුමන් කරගෙන යන ජනතා මෙහෙවර කරගෙන යෑමට ශක්තිය ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරන ලදි. එසේම ගරු සභාපතිතුමන් ඉදිරියටත් මේ සභාවේ සිටිය යුතු බව මන්ත්‍රීතුමන්ගේ මතය වේ. එනිසා සභාවේ සියළු මන්ත්‍රීතුමන්ලා එක්ව සභාපතිතුමන්ට සහය දැක්විය යුතුවේ. ඒ වෙනුවෙන් මන්ත්‍රීතුමන්ලා ගරු සභාපතිතුමන් නියෝජනය කරන කොට්ඨාශයේ මැතිවරණ ප්‍රචාරන කටයුතු සඳහා සම්බන්ධ වන බවත්, සභාපතිතුමන් වෙනුවෙන් වැඩ කරන බවත්, සභාවේ සිටින ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු සියළුදෙනාටම මහජන සේවය කිරීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරන ලදි.මන්ත්‍රීතුමන්ලා කරන කැප කිරීම් පිළිබඳව හොඳින් දන්නා බවත්, මන්ත්‍රීවරයකුට කල හැකි වැඩ ප්‍රමාණයක් පවතියි. ඒ ප්‍රමාණය ඉක්මවා ගොස් ඇමති කෙනෙකු කරන වැඩ කොටස කල නොහැකි බවත්, මන්ත්‍රීවරයකු ලෙස ගම්මානවලට කල හැකි වැඩ කොටස සියළුම මන්ත්‍රීවරු සිදුකර තිබෙන බවත්, පෙන්වාදෙන ලදි. ඒවාගේම ගරු සභාපතිතුමන්ට නැවත වරක් සභාපතිතුමන් ලෙස මෙම පුටුවේ සිටිනු දැකීම මන්ත්‍රීතුමන්ගේ එකම බලාපොරොත්තු වන බවත්,එයට සුභාශිංෂණ එක් කරමින් ගරු මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>09.07.ගරු මන්ත්‍රී - ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා</u>**

ගරු මන්ත්‍රී ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා සභාවට අදහස් දක්වමින්, අප රට යටත් විජිතයක් වශයෙන් පැවති අධිරාජ්‍යවාදීන්ගේ නිදහසින් පසුව 75 වසරක් ගෙවීයන මේ මොහොතේ ප්‍රාදේශීය සභා ධූර කාලයද අවසන්වේ.මේ ප්‍රාදේශීය සභා ධූර කාලය අවසන් වන්නේ අවරුදු 05 ක් ගතවීමෙන් පසුවයි. මෙම ප්‍රාදේශීය සභා මැතිවරණය පවත්වා එහි සභිකයින් තෝරාගෙන මාස 21 ක් ගත කරන්නට වූයේ යහපාලන ආණ්ඩුව යටතේයි. ඉන්පසුව මහමැතිවරණය හා ජනාධිපතිවරණය වෙනවෙන් කැපවී කටයුතු කල බවත්, ඒ වන විට සභාවේ ධූර කාලයෙන් මාස 30 ක් ගෙවී අවසන්වී තිබුණි.ඉන්පසුව මේරටත් ලෝකයත් වෙලාගත් කොරෝනා වසංගතය පැමිණියේ. එයිනුත් මන්ත්‍රීතුමන්ලාගේ වැඩකටයුතු සියල්ල සිදුකර ගැනීමට අවහිර වූ බවත්, සංවර්ධන වැඩකටයුතු,පෞද්ගලික ක්‍රියාකාරකම්,තමන්ගේ වෘත්තීන් රැකියාවන් සියල්ල රටේ ජනතාවට අහිමිවිය. එසේ රැකියා අහිමිවූ අවස්ථාවක රටට බොහෝ සෙයින් ආදායම් අහිමිවී සියළුම අංශවලින් කඩා වැටුණු මොහොතකයි අරගලයක් කියා රටේ මිනිසුන්ගේ දැවෙන ප්‍රශ්න තියෙනවා කියා දේශපාලන පක්ෂයක් නොමැති කණ්ඩායමක් අරගලයට එක්වුණි.රටට ආදරය කරන තරුණයින් පිරිසක් එක්වී අරගලය ආරම්භ කලත් ඒ අරගලයේ සැබෑ තත්වය රටට හෙලි කිරීමට දේශපාලන මැදිහත්වීම තුල නොහැකිවිය. ජනතා විමුක්ති පෙරමුණ අරගලයට එක්වී එම කණ්ඩායම් වෙනස් කර මේ අරගලය අලගලයක් කල බව සඳහන් කරන ලදි. ඒ උගත් බුද්ධිමත් පරම්පරාව විසින් රටේ ඇති විය යුතු සංශෝධන ප්‍රතිසංශෝධන ඒ සියළුදේ කර ගැනීමට නොහැකිවූ බවත්. අරගලයෙන් නැගී ආ තරුණයින්ගේ අදහස් ඉදිරිපත් කර ගැනීමට නොහැකිවූයේ ජනතා විමුක්ති පෙරමුණ එයට මැදිහත්වී එයට උල්පන්දම් දී එය දේශපාලන වාසියක් කරගෙන ඔවුන්ගේ පැත්තට හරවා ගැනීමට ගත් උත්සාහයක් නිසායි.

එසේ කාලය ගතවී යන විටයි මැතිවරණයක් ක්‍රියාත්මක වූයේ. මන්ත්‍රීතුමන්ලාට වැඩක් කරගැනීමට හැකි කාලය මාස 07 කට 08 කට සීමා වුනි. ඒ සම්බන්ධයෙන් කතා කරනවා නම් නව

මැතිවරණ ක්‍රමයක් ඔස්සේ මන්ත්‍රීතුමන්ලාට මැතිවරණයකට මුහුණ දීමට සිදුවූ බවත්, ඒ මැතිවරණයේ තිබූ යම් යම් අඩුපාඩුකම් දුරලා ඉදිරි මැතිවරණය පවත්වයි කියා විශ්වාස කරන බවත්, දැනටත් මේ පවතින්නේ සභාවේ අවසාන භාගයයි.බොහෝදුරට මන්ත්‍රීතුමන්ලාගේ සභා කාලයේ අවසන් සභා රැස්වීම විය හැකියි. එය කෙසේ වෙතත් එදා ඒ අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයෙන් පසුව අපේ රට දේශපාලනීයකරණයට ගොස් නොයෙකුත් පක්ෂ තමන්ගේ දර්ෂණය ඉදිරිපත් කරමින් මේ රට මාරුවෙන් මාරුවට පාලනයකරන ලදි. එදා මෙදාතුර පවතින ආණ්ඩුවට සහය දක්වා අරගලය නැවැත්වීමට විපක්ෂයද උදව් උපකාර කර විපක්ෂයද විවිධ අරගල ගෙනාවා. මේවා සාධාරණ හේතුමත ගෙනආ අරගලවේ. අද මේ අරගලය හේතුවෙන් තැන්තැන්වල රැස්වී සමාජ මාධ්‍ය ජාලය ඔස්සේ රටේ ලෝකයේ දැනුමක් නැති ඇතැම් තරුණ පිරිස් ජනතා විමුක්ති පෙරමුණ සමග එක්වී මේ වැඩකටයුතු කරගෙන යන විට තමයි. ඔවුන් නොයෙකුත් ත්‍රස්තවාදී වැඩ කරමින් විනාශකාරී අන්දමට වැඩ කරමින් ජනතා විමුක් පෙරමුනේ 87/88/89 කාලයේ තිබූ භීෂණය නවක දරුවන්ට ඇත්තටම පෙන්වා දිය යුතුයි.ඔවුන් ගැන මන්ත්‍රීතුමන්ලා නිතර කතා කිරීමට අවශ්‍ය නොවේ. ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක නැමති නායකයා මේ රටේ සිදුකල සියළු සංවර්ධන කටයුතු සඳහා අකුල් හෙළු කකුලෙන් ඇදිම් කල රටේ සිටින හොදම නායකයා අනුර කුමාර දිසානායක මහතායි. එසේම තමයි උදය බන්දුල මන්ත්‍රීතුමා මේ සභාවේදී සෑම දෙයක්ම හැකි ආකාරයෙන් විවේචනයට ලක්කරන ලදි. මීට ඉහතදී රටට ආදරය කරනවා, රටහදනවා රට රකිනවා කියන කට්ටිය එදා බස්රථ වලට ගිණි තැබූ පිරිස් දනියි.එදා කුඩා ළමුන් ලෙස නගරයේ ජීවත්වූ අයකු ලෙස මන්ත්‍රීතුමන්ලා ඒවාට මුහුණ දුන් බව ප්‍රකාශ කරන ලදි. ට්‍රාන්ස් පෝමර් කඩා, රටේ ඇති සංවර්ධන කටයුතු අඩපන කර , පිටුපසට වෙඩි තබා , හැඳුනුම්පත් ලබාගෙන දැන් කියනවා රට ගොඩනැගීමට සිටින , මේ රට ගොඩ දැමීමට සිටින එකම දේශපාලන පක්ෂය කියා පවසයි. මේ සඳහා රැවටෙන ඉතාමත් අඩු මිනිසුන් පිරිසක්ද සිටියි. මන්ත්‍රීතුමන්ලා ඔවුන්ට අනුකම්පා කරන බව ප්‍රකාශ කරන ලදි. මන්ද ඔවුනුත් ඔවුන්ගේ දර්ශණය දැනගනීවි;

ඒවාගේම මේ අරගලය නිසා මේ මැදගම පත්තුවටම විශාල හානියක් ඇති විය. එයින් විශේෂයෙන්ම ගත්කල මන්තීරු හතරකට මාර්ගය පුළුල් කර නව මාර්ග පද්ධතියක් සකස් කර මැදගම නගරය මන්තීරු 04 කින් යුතු නවීකරණයවූ නගරයක් නිර්මානය කිරීමට මන්ත්‍රීතුමන්ලා තුල තිබූ බලාපොරොත්තුව උත්සාහය පරමාර්ථය නැතිවී ගියා ජනතා විමුක්ති පෙරමුනේ අරගලය නිසා. එනිසා මේ නගරය සංවර්ධන කර ගැනිමට කාලයක් බලා සිටීමට සිදුවේ. මන්ත්‍රීතුමන්ලාත් කැමතියි තරුණයින් ලෙස එතුමන්ගේ යහළුවන් නගරයට පැමිණියාම මෙයත් නගරයක් සේ දැකීමට පරිසරයක් නිර්මාණය කිරීමට කැමැත්තක් දක්වන බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම උදය බන්දුල මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් යමක් තේරුම් ගැනීමට හැකි පුද්ගලයෙක් වේවි කියා හිතුවත් එතුමන් එසේ නොවන පුද්ගලයකු බව අද හොඳින් වැටහී ගියා.දේශපාලනය කරන විට ඕනෑම දෙයක් දරා ගැනීමට හුරු විය යුතුයි. ජය පැරදුම කාටත් පොදුයි. ජයග්‍රහණය වෙලාවේ ජයග්‍රාහී ලීලාවෙන් ජයග්‍රහණයේ අභිමතාර්තයන් ඉටුකර ගත යුතුයි. මන්ත්‍රීතුමන්ලා ප්‍රාදේශීය සභාවට තෝරා පත්කර එවූයේ ගමට යම්කිසි සේවයක් බලාපොරොත්තුවෙණි. මන්ත්‍රීතුමන්ලාට අද ගමට ගොස් මේවසර 05 ක කාලය තුල යම් සේවයක් ගමේ ජනතාව වෙනුවෙන් සිදුකලා කියා කීමට හැකියාවක් පවතියි. එසේ කීමට ප්‍රධාන හේතූන් පවතියි.නායකයින්ගේ ආශිර්වාදයෙන්, ගරු සභාපතිතුමන්ගේ ආශිර්වාදයෙන් ගම්වල උපරිම ශක්තිය යොදවා වැඩසටහනක් කිරීමට උත්සාහ ගත් බවත්, එම වැඩකටයුතු සිදුකර අවසන් කර ඇති බවත්, ප්‍රකාශ කරන ලදි. එසේම එළබෙන මැතිවරණයට මන්ත්‍රීතුමන් කිසිසේත් බය නොවන බවත්, මන්ත්‍රීතුමන්ගේ කොට්ඨාශය තුල අවශ්‍ය ඡන්ද ප්‍රමාණය ලබා ගැනීමට හැකියාව තිබෙන බවත්, එදා සිට මන්ත්‍රීතුමන්ලා සමග සිටි ජනතාව 100% ක් ම නොවේ යම් ප්‍රමාණයක් ජනතා විමුක්ති පෙරමුණේ බොරුවලට හසුවී ජනතා විමුක්ති පෙරමුණ සමග සම්බන්ධවී සිටියි.

මන්ත්‍රීතුමන්ලා සැම විටම උත්සාහ ගන්නේ පැවතුනාවූ පදනම ඉදිරියටත් පවත්වාගෙන යැමටයි. මන්ත්‍රීවරයකු ලෙස සභාවට පැමින කොට්ඨාශයේ ජනතාවට කල හැකි සේවය සම්බන්දයෙන් මන්ත්‍රීතුමන් සතුටට පත්වන බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම නිවරැදි කල යුතු ප්‍රශ්නයක් පවතියි. ජයසුන්දර මැතිතුමන්ගේ අදහස් දැක්වීම තුල බව පැවසුවා ජනතා විමුක්ති පෙරමුණට බැදෙන අයගේ මල ගෙදරකටවත් ගොස් අඩියක්වත් නොහහන බව ප්‍රකාශ කරන ලදි. ජයසුන්දර මන්ත්‍රීතුමන් සුරා සූදුවෙන් තොර අයෙකි. එතුමන් අඩියක් ගහන්නෑ කිව්වේ. එය බන්දුල මන්ත්‍රීතුමන් නිවෙස්වලට ගොස් අඩියක් ගහන්නේ නෑ කියා සිතා වැරදියට තේරුම් ගෙන සිටියි. එවන් පුද්ගලයින් මේ රට හැදීමට ඡන්දය ඉල්ලන බව පවසමින් ගරු මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>09.08.ගරු මන්ත්‍රිනී- යූ.ටී.එම්.තරංගා චිත්‍රාණී පුෂ්පලතා මැතිතුමිය.</u>**

ගරු මන්ත්‍රිනී යූ.ටී.එම්.තරංගා චිත්‍රාණී පුස්පලතා මැතිතුමිය සභාවට අදහස් දක්වමින්, පුරා වසර 04 ක් තිස්සේ මේ සභාව තුල ගරු සභාපතිතුමන් සමග සහයෝගයෙන් වැඩ කල බව මුලින්ම සදහන් කරන ලදි.ගරු සභාපතිතුමන් මේ සභාවේදී ලබා ගන්නා තීන්දු තීරන සත්‍ය වශයෙන්ම නිවැරදි තීන්දු තීරණවේ.

ඒවාගේම සභාවේ අදහස් දැක්වීමට අවස්ථාවක් නොලැබිය හැකියි. එනිසා සභාපතිතුමන් ගැන යමක් පැවසිය යුතු බව ප්‍රකාශ කරන ලදි. ගරු සභාපතිතුමා මේ සභාවේ සිටය යුතුම නායකයෙකි.මන්ද එතුමා මේ ප්‍රදේශවල සිටිය මන්ත්‍රීවරු ඇමතිවරුට වැඩිය නගරය සකස් කර තිබේ.මංමාවත් සකස් කර තිබේ.ජනතාවට පහසුකම් සපයා දී තිබේ.එම නිසා එම නායකයා යලිත්වරක් මේ සභාවේ සභාපතිවරයා විය යුතුයි යන්න ප්‍රාර්ථනා කරන ලදි. මන්ත්‍රීතුමිය සභාපතිතුමන්ගේ පැත්ත ගෙන කතා කරේ අවුරුදු 04 ක කාලයක් එතුමන්ට උදව් කලේ විශේෂ හේතුවක් නිසා නොවේ. එතුමාගේ හොද ගතිගුණ නිසායි.මන්ත්‍රීතුමියගේ පියා මියගිය අවස්ථාවේදී සභාපතිතුමන් උදව් කල ආකාරය ගැන කියා ගත නොහැකි සතුටක් පවතින බව ප්‍රකාශ කරන ලදි.එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමියගේ පියා මිය ගිය පසු එදා සිටිය මන්ත්‍රීවරුවත් ඇමතිවරුවත් ඒ පිළිබදව සොයා බැලුවේ නැති බවත්, එදා ඇයගේ පියා වෙනුවෙන් නොපිරිහෙලා යුතුකම් ඉටු කලේ ගරු සභාපතිතුමායි. එයට එතුමන්ට ගෞරව කරන බවත් ස්තූතිය පුද කරන බවත් සදහන් කරන ලදි.

ඒවාගේම මන්ත්‍රීතුමිය මෙවර මැතිවරණයට ලැයිස්තුවෙන් ඉදිරිපත් වන බවත්, එතුමිය යටතේ ඇගළුම් ආයතනයක් පවතින බැවින් කැපකිරීම් කිරීමට අපහසුවේ. මන්ත්‍රීතුමිය දේශපාලනයෙන් ඉදිරියට යන විට ඒ ගමනට කැපිලි දාන අය සිටියි.ඒ අයගෙන් ඉවත්වී තනිවම මේ ගමන යැමට තීරණය කල බව ප්‍රකාශ කරන ලදි. මන්ද එක්සත් ජාතික පක්ෂයේ තනි කාන්තා මන්ත්‍රීවරිය ලෙස අද දවසේ මේ සභාව නියෝජනය කරන බවත්, එක්සත් ජාතික පක්ෂයෙන් මන්ත්‍රීතුමිය පළාත් සභාවට ගොස් පාර්ලිමේන්තුව දක්වා යන බව ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමිය ආයතනයක් පිහිටුවාගෙන එම ආයතනයට තවත් කාන්තාවන් පිරිසක් හා පිරිමි පාර්ශවය එකතු කරගෙන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන බවත්, මොනරාගල දිස්ත්‍රික්කයේ ඇමතිවරු මන්ත්‍රීවරුන්ට බැරිවූ දෙයක් මන්ත්‍රීතුමිය සිදු කර තිබෙන බව ප්‍රකාශ කරන ලදි. මන්ද මන්ත්‍රීතුමියට උදව් කල අනෙක් අයටද උදව් කල පිරිසක් එතුමියගේ ආයතනයේ සේවය කරන බව ප්‍රකාශ කරන ලදි. ගරු සභාපතිතුමන්ටත් ගොඩාක් උදව් කල අය මන්ත්‍රීතුමියගේ ආයතනයේ සිටින බව ප්‍රකාශ කරන ලදි. ඒ අය ඡන්දය ලබාදීමෙන් වැලකී සිටීමට තීරණය කර තිබුනත් මන්ත්‍රීතුමිය ඡන්දයට ඉදිරිපත් වන නිසා ඡන්දය ලබාදෙන බව පවසයි.ඒ ඡන්ද ප්‍රමාණය එතුමියට ප්‍රමානවත් වන බව

ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමියගේ ආයතනය වැඩි දියුණු කර ගැනීමට බලාපොරොත්තු වන බවයි. එසේ දියුනු කරමින් මේ පුරවරයේ සිටින සියළුම කාන්තාවන්ට ඒවාගේම පිරිමි පාර්ශවය අයට. රැකියා ලබාදී මේ පළාතේ ඇති විශාලතම ඇගළුම් කර්මාන්ත ශාලාව බවට මන්ත්‍රීතුමියගේ කර්මාන්ත ශාලාව පත්කිරීමට බලපොරොත්තුවන බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගෙම පුරා වසර 04 කට වැඩි කාලයක් සභාපතිතුමා,උප සභාපතිතුමා, සභා ලේකම්තුමන්ලා කිහිප දෙනකුම සේවය කලා ඒ සියළු දෙනාටත්, ඒවාගේම විපක්ෂ නායකතුමන් ලෙස නිමල් මන්ත්‍රීතුමන් ගොඩාක් ගුරු හරුකම් ලබාදුන්නා යහමග යන්නට කියා දුන්නා එතුමන්ට මන්ත්‍රීතුමියගේ හදපිරි ස්තූතිය පුද කරන ලදි. එසේම මන්ත්‍රීතුමියට උදව් උපකාර කල සියළුම මන්ත්‍රී මණ්ඩලයටත් ස්තූතිය ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීතුමියට ඉදිරියට යෑමට වචනයකින් හෝ උදව්කල සියළුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු මන්ත්‍රීතුමියගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>09.09.ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා</u>**

මාසික සභා රැස්වීමේ කටයුතු නිමා කිරීමට ගරු සභාව ඇමතූ ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා අද දිනයේ සභා රැස්වීමේ කටයුතු සදහා සහභාගිව අදහස් දක්වා යහපත්වූ බල ප්‍රදේශයක් ගොඩනැගීම සදහා කැපවී අදහස් ඉදිරිපත් කල ගරු උප සභාපතිතුමන් ප්‍රධාන සමස්ථ මන්ත්‍රී මණ්ඩලයටත්, සභා ලේකම්තුමා ඇතුළු සභාවේ කාර්ය මණ්ඩලයටත් විශේෂ ස්තූතියක් පුද කරන ලදි.

විශේෂයෙන් අද දිනයේ මන්ත්‍රීතුමන්ලා තම තමන්ගේ පක්ෂය වෙනුවෙන් අදහස් ප්‍රකාශ කල අතර, එසේම තම තමන්ට සිදුවූ හිරිහැර බාධක සම්බන්ධයෙන්ද සාකච්ඡා කල බව සදහන් කරන ලදි. සභාපතිතුමන්ලාටද එවන්වූ අඳුරු අතීතයක් පැවතුණි.ඒ අඳුරු අතීතයෙන් මගහැරී එලිය දැක තිබෙන බව ප්‍රකාශ කරන ලදි. ගරු සභාපතිතුමන්ටත් විවිධ චෝදනා එල්ල කල බවත්, කුහක කම කියන වචනයේ තේරුමවත් සභාපතිතුමන් නොදන්නා බවත්, එවන්වූ අත්වැරද්දක්වත් සිදුකර නොමැති බව ප්‍රකාශ කරන ලදි. සිදකල දෙයක් ඇත්නම් ඒ වැඩි දෙනාගේ යහපත වෙනුවෙන් සිදු කරන දේයි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා අදහස් දක්වා සභාවෙන් පිටව යයි.සිරිත් පරිදි අද දිනයේද පිළිතුරු ලබාදීමට පෙර සභාවෙන් පිටත්ව යෑම කනගාටුවට කරුණක් බව ප්‍රකාශ කරන ලදි. එය කෙසේ වුවත් සබාපතිතුමන්ලාට අතීතයක්සේම වර්තමානයක් පවතියි.ඒ සිදුවූ සියළු දේ මතකයේ තිබෙන බවත්, එම සිදුවීම් හෙලා දකින බව ප්‍රකාශ කරන ලදි. සමහර පිරිස් අන්තරා භවයක් වැනි කාලයක් තිබෙන නිසා සිහින ලෝකවල ජීවත්වේ . හෙට දිනයේ හෝ නුදුරු දිනකදී මැතිවරණය පවත්වනවාද නැද්ද යන්න සම්බන්ධයෙන් තීරණයක් ලැබෙයි කියා විස්වාස කරන බවත්, එසේ තීන්දුවක් ලැබුන පසු මැතිවරණ ව්‍යාපාරයට බැස කටයුතු කරමු. ඒවනතුරු සංවර්ධන වැඩ කටයුතු නොනවත්වාම පවත්වාගෙන යෑමට බොහොමත්ම ගෞරවයෙන් යෝජනා කරන ලදි.

එසේම මේ කාලය තුල සියළුම දෙනා ගරු සභාපතිතුමන්ට සහය දැක්වූවා.මෙය අවසන් සභා රැස්වීම නොවේ.මාර්තු මාසයේද සභා රැස්වීම පැවැත්වේ. එම මාසයේ මුල් සතියේ හෝ රැස්වීම පැවැතිවීමට බලාපොරොත්තුවන බව ප්‍රකාශ කරන ලදි. ඒවාගේම සභාවේ මන්ත්‍රීතුමන්ලා තම තමන්ගේ අදහස් ඉදිරිපත් කලා ඒ සම්බන්ධයෙන් ස්තූතිය පුද කරන ලදි. ඒවාගේම ඉදිරි දින කිහිපය බොහොම කාර්යක්ෂමව වැඩ කිරීමට සිදුවේවි.ආරම්භ කල වැඩ කටයුතු බොහොමයක්

පවතියි.ඉදිරි මාසය තුල එම සංවර්ධන කටයුතු සඳහා සහයෝගය දක්වන ලෙසට බොහොමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටින ලදි.

විරුද්ධවාදීන්, ත්‍රස්තවාදීන් එක ගොන්නකට එකතුවී සිටියි නගරයේ සංවර්ධන කටයුතු නැවැත්වීමට.අදත් කඩ කිහිපයක් ඉවත් කලා ඒ කඩ ඉවත් කර මාර්ගය කඩිනමින් සකස් කිරීමට සිදුවන බවත්, කවුරු මොනදේ කලත් නගරයේ ජනතාවගේ යහපත වෙනුවෙන් කටයුතු කලයුතුයි. ඒවාගේම සමස්ථ මැදගම පත්තුවේම ජනතාවගේ යහපත වෙනුවෙන් කටයුතු කිරීමට බොහොමත්ම ගෞරවයෙන් යෝජනා කරමින්, පැමිණි සියළු දෙනාට යහපත්වූ හෙටක් සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් ගරු සභාපතිතුමන් සභා රැස්වීමේ කටයුතු නිමා කරන ලදි.

**10.** මීලඟ සභා රැස්වීම 2023.03.08 වන දින පෙ.ව. 9.30 ට මැදගම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට තීරණය කරන ලදි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2023.02.09

මැදගම ප්‍රාදේශීය සභාව.

පිටපත්:-

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමා, බදුල්ල - කා.දැ.ගැ.ස.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා, මොණරාගල - කා.දැ.ගැ.ස
03. විගණන අධිකාරීතුමා , මොණරාගල. - කා.දැ.ගැ.ස